# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1713/7 - 2011 ජූලි මස 05 වැනි අඟහරුවාදා - 2011.07.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනත**
**ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් : පොදු**

සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල්, එච්. එම්. සී. නිමල්සිරි වන මම, 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනතේ 120 (1) වගන්තිය ප්‍රකාරව මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් මින් නිකුත් කරමි.

එච්. එම්. සී. නිමල්සිරි
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්
සහ ප්‍රධාන විධායක නිලධාරී.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,
64, ගාලු පාර,
කොළඹ 03.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

**ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති**

(2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනතේ 120 වගන්තිය ප්‍රකාර නිකුත් කරන ලදී.)

**මාතෘකාව : පොදු**

යොමු අංක : CA-IS-2010-GEN-001     අනු අංකය : IS-001     දිනය : 2010 ඔක්තෝබර් 27

2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනතේ 120 වගන්තිය ප්‍රකාර, සකස් කිරීම අවශ්‍ය වේයයි හෝ උචිත වේයයි හෝ අදහස් කරන අවස්ථාවක පනතේ උපලේඛනයෙහි නිශ්චිත කොට දක්වා ඇති ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සම්මුතියෙහි ව්‍යවස්ථා ද ඇතුළුව සිවිල් ගුවන් සේවා පනතේ විධිවිධාන කිසිවක් හෝ එම පනත යටතේ පනවා ඇති රෙගුලාසි කිසිවක් හෝ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති නිකුත් කිරීමට සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්ට බලය හිමි විය යුතුය.

1A - G 14749— 380 (2011/07)

මේ අනුව පහත අත්සන් තබන මම, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්, ඉහත සඳහන් කරන ලද පනතේ විධිවිධාන සහ එහි උපලේඛනයෙහි නිශ්චය කොට දක්වා ඇති, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සම්මුතියෙහි 37 වන ව්‍යවස්ථාව යටතේ විස්තර කර ඇති ප්‍රමිති සහ කාර්ය පටිපාටි ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා මීට යාකොට ඇති ඇමුණුමේ (යොමු ඃ CA-IS-2010-GEN-001-ATT-01) සඳහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති මෙයින් නිකුත් කරමි.

මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති වහාම ක්‍රියාත්මක වන පරිදි බලාත්මක වනු ඇති අතර අවලංගු කරන තෙක් බලාත්මක පවතිනු ඇත.

වෙනත් කරුණු අතර, ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති වලට අනුකූලව කටයුතු නොකිරීම වරදක් බව සඳහන් වන, පනතේ 103 වගන්තිය කෙරෙහිද අවධානය යොමු කරවමි.

එච්. එම්. සී. නිමල්සිරි
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්
සහ ප්‍රධාන විධායක නිලධාරී

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,
64, ගාලු පාර,
කොළඹ 03.

මේ සමග ඇති ඇමුණුම් අංක ඃ CA-IS-2010-GEN-001-ATT-01

**ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති**

***මාතෘකාව - පොදු***

1. මේ සමඟ ඇති 1 සටහනෙහි ඇතුලත් සේවා නිරුපද්‍රතතා නිවේදන (ASN) නිකුත් කරනු ලැබ ඇත්තේ 2002 සිවිල් ගුවන් සේවා (අතුරු) රෙගුලාසි ප්‍රකාර සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත පැවරී ඇති බලතල යටතේ ය. මෙම ගුවන් සේවා නිරුපද්‍රතතා නිවේදන(ASN) ද, පනතේ විධිවිධාන සහ පිළිවෙලින් 1 සටහනෙහි 4 වන සහ 5 වන තීරුවල සඳහන් කර ඇති චිකාගෝ සම්මුතියෙහි සහ එහි ඇමුණුම් වල ඇතුලත් වන ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් බලාත්මක කිරීම සඳහා 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනතේ 120 වගන්තිය ප්‍රකාර සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති වශයෙන් තේරුම් ගෙන පිළිගත යුතුය.

2. අදාල ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියට යොමු කරන විට ASN අංකය, නිකුත් කිරීම් අංකය (ප්‍රවර්තන) සහ එහි මාතෘකාව ද සමඟ මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියෙහි යොමු අංකය ද සඳහන් කළ යුතුය. (උදා ඃ CA-IS-2010-GEN-001(ASN)42 - නිකුත් අංක ඃ 06 - ''වාණිජ ගුවන් ප්‍රවාහණ මෙහෙයුම් වල නිරතවන ගුවන් යානා සඳහා වන මෙහෙයුම් අවශ්‍යතා'')

3. එකිනෙක ගුවන් සේවා නිරුපද්‍රතතා නිවේදනයක වසුන් පිටුවේ "Nature" (Item 2) යටතේ සඳහන් පරිදි යෙදුම කුමක් වුවද ඒ ගැන නොසලකා ගුවන් සේවා නිරුපද්‍රතතා නිවේදනයෙහි අනුවෘත්‍යය මට්ටම බද්ධතාව සහ මගපෙන්වීම සම්බන්ධව සලකන කල පහත සඳහන් අර්ථකතනයන් සියල්ල අභිභවා සිටිය යුතුය.

   (අ) ගුවන් සේවා නිරුපද්‍රතතා නිවේදනයක(ASN) පෙළෙහි "Shall" යන යෙදුම අඩංගු වන්නේනම් ඉන් අදහස් කළ යුත්තේ ප්‍රමිති අවශ්‍යතාව අත්‍යාවශ්‍ය බවත් එය විධානාත්මක බවත් ය. මෙහිදී ඒ සමඟ අනුවෘත්‍යය පැවැත්වීම අවශ්‍ය වන අතර ක්‍රියාත්මක කිරීම අනිවාර්යය වේ.

   (ආ) ගුවන් සේවා නිරුපද්‍රතතා නිවේදනයක(ASN) පෙළෙහි "Should" යන යෙදුම අඩංගු වන්නේනම් ඉන් අදහස් කළ යුත්තේ අදාළ ප්‍රමිති අවශ්‍යතාව සමඟ අනුවෘත්‍යය පැවැත්වීම කමනීය බවයි. නැතහොත් ප්‍රයෝජනවත් බවයි. එය ක්‍රියාත්මක කිරීමට බල කිරීමක් සිදු නොවේ.

4. අවස්ථාවෝචිතව අධිකාරිය විසින් හෝ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් හෝ සිවිල් ගුවන් සේවා පනතේ හෝ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවල හෝ ඇතුලත් විධිවිධානයක් යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක්, සහතිකයක්, අවසරපත්‍රයක් හෝ වෙනත් ආකාරයක අනුමැතියක් ප්‍රථම වර නිකුත් කිරීම, අළුත් කිරීම, සංශෝධනය කිරීම හෝ බලාත්මක කිරීම හෝ සම්බන්ධව අධිකාරිය සමඟ හෝ සිවිල් ගුවන් සේවා අධිකාරිය සමඟ හෝ ගණුදෙනු කරන කිසියම් පුද්ගලයෙකු එවැනි

කරුණුවලට අදාල මතු දක්වෙන ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිවල ඇතුලත් අදාළ අවශ්‍යතාවන්ගෙන් මාර්ගෝපදේශ ලබාගත යුතු අතර එහිදී ඉහත 3වන ඡේදයේ සඳහන් අර්ථ දක්වීම්වලට ද අනුකූල විය යුතුයි. ගුවන් සේවා නිරුපද්‍රතතා නිවේදන නිරන්තරයෙන් යාවත්කාල කෙරෙන හෙයින් අදාළ ගුවන් සේවා නිරුපද්‍රතතා නිවේදනයට යොමු කරන විට එහි අන්තිම නිකුතුවට යොමු කිරීම අවශ්‍ය වේ.

ඇමුණුම් අංකය CA-IS-2010-GEN-001-ATT-01

| අනු අංකය | ASN අංකය | විෂය කරුණු | පනතට යොමුව | ඇමුණුව |
|---|---|---|---|---|
| 1. | *ASN* 002 | සැලසුමට අදාළ ගුවන් යෝග්‍යතා සහතික නිකුත් කිරීම සඳහා වන අවශ්‍යතා | 2 වග. උපලේ - 31 සහ 37 ව්‍යව | ඇමුණුම 08 |
| 2. | *ASN* 004 | ඉගිලුමේදී තත්‍යය හෝ සැක කළ හෝ ටයර් පිපිරීමකදී අණදෙන ගුවන් නියමුවා විසින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි | | |
| 3. | *ASN* 005 | 2000 මැයි මාසයට පෙර නිකුත් කරන ලද වර්ග ප්‍රමාණන රහිත ගුවන් යානා නඩත්තු ඉංජිනේරු (AME) මූලික බලපත්‍රයක් ඉල්ලීමක් මත ගුවන් යානයකට විශේෂිත වූ ගුවන් යානා නඩත්තු ඉංජිනේරු (AME) මූලික බලපත්‍රයක් බවට පරිවර්තනය කිරීම | 2 වග.උපලේ - 37 ව්‍යව<br>67 වග. ගු.ස.රෙ. 25, 26 සහ 27 | ඇමුණුම 08 |
| 4. | *ASN* 007 | ACAS II සහ පීඩනය සහ උන්නතාංශය වාර්තා කිරීමේ සම්ප්‍රේෂක ප්‍රතිචාරක ශ්‍රී ලංකා ගුවන් යානා තලයෙහි අනිවාර්‍යයෙන් රැගෙන යාම | 2 වග, උපලේ - 37 ව්‍යව | ඇමුණුම 08 |
| 5. | *ASN* 008 | ගුවන් යානා නඩත්තු ඉංජිනේරු - මූලික බලපත්‍ර (AME - BL) විභාගය පැවැත්වීමේ පරිපාලනමය කාර්ය පටිපාටි | 2 වග, උපලේ - 37 ව්‍යව 66 වග෴ | ඇමුණුම 08 |
| 6. | *ASN* 009 | පියසර අවසර පත්‍ර | 2 වග, උපලේ - 37 ව්‍යව | ඇමුණුම 08 |
| 7. | *ASN* 010 | අනුමත කරන ලද ගුවන් යානා නඩත්තු උපලේඛනවලට වෙනස් කම් | 2 වග, උපලේ - 37 ව්‍යව58 වග, | ඇමුණුම 08 |
| 8. | *ASN* 011 | අපනයන ගුවන් යෝග්‍යතා සහතිකය | 2 වග, උපලේ - 37 ව්‍යව51 වග, | ඇමුණුම 08 |
| 9. | *ASN* 012 | ගුවන් යානා සඳහා බර සහ තුලන අවශ්‍යතා | 2 වග, උපලේ - 37 ව්‍යව51 වග, | ඇමුණුම 08 |
| 10. | *ASN* 013 | කිසියම් පුද්ගලයෙකු ගුවන් යානයක නිරුපද්‍රිත මෙහෙයුමට මැදිහත් වීම පිණිස පියසර කම්ටුවට ඇතුල් වීම වැළැක්වීම සඳහා නිරුපද්‍රතතා සහ සුරක්ෂිතතා පියවර හඳුන්වා දීම | | ඇමුණුම 06 |
| 11. | *ASN* 014 | සේවා දුෂ්කරතා වාර්තා කිරීමේ වැඩසටහන (SDR) | | ඇමුණුම 08 |
| 12. | *ASN* 015 | අනිවාර්‍යය ප්‍රකාශන සහ නිවේදන | | ඇමුණුම 08 |
| 13. | *ASN* 016 | මෙහෙයුම් ව්‍යුත්පන්න උපකරණ අවශ්‍යතා | 2 වග, උපලේ - 37 ව්‍යව48 වග, | ඇමුණුම 08 |

| අනු අංකය | ASN අංකය | විෂය කරුණු | පනතට යොමුව | ඇමුණුමව |
|---|---|---|---|---|
| 14. | *ASN* 017 | අනුමත කාර්ය පටිපාටි - නවීකරණ - අළුත් වැඩියා | 2 වග, උපලේ - 37 ව්‍යව | ඇමුණුම 08 |
| 15. | *ASN* 018 | නාවික සහ ළගාවීමේ ආධාරක වශයෙන් ශ්‍රී ලංකා ගුවන් තලයෙහි භාවිතා කිරීම සඳහා GPS | 2 වග, උපලේ - 37 ව්‍යව | ඇමුණුම 08 |
| 16. | *ASN* 019 | විදේශ අනුමත නඩත්තු සංවිධාන වලංගු කිරීම | 2 වග, උපලේ - 37 ව්‍යව92 වග, | ඇමුණුම 08 |
| 17. | *ASN* 021 | ගුවන් යානා, එන්ජින් සංරචක සහ ද්‍රව්‍ය විනාශකාරී නොවන අත්හදා බැලීම් (NDT) සඳහා පුද්ගලයින් සහතික කිරීම | 2 වග, උපලේ - 37 ව්‍යව48 වග, | ඇමුණුම 08 |
| 18. | *ASN* 022 | ගුවන් යානා පැස්සුම්කරුවන් සහතික කිරීම | 2 වග, උපලේ - 37 ව්‍යව48 වග, | ඇමුණුම 08 |
| 19. | *ASN* 023 | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් යානා/ ගුවන් ප්‍රවාහණ සමාගම් තුළ පොදු ගුවන් ප්‍රවාහණ කටයුතු සඳහා සේවයෙහි යොදවා ඇති පියසර පිරිස් සාමාජිකයන්ගේ සහ මැදිරි සේවක පිරිස් සාමාජිකයින්ගේ වෙහෙස කළමනාකරණය සඳහා, පියසර කාලය, පියසර රාජකාරී වේලාවන්, රාජකාරී වේලාවන් සහ විවේක වේලාවන් පිළිබඳ සීමා පැනවීම් | 2 වග, උපලේ - 37 ව්‍යව | ඇමුණුම 06 |
| 20. | *ASN* 024 | ස්වේච්ඡා හෙළිදරව් වාර්තා කිරීමේ කාර්ය පටිපාටි | | ඇමුණුම 13 |
| 21. | *ASN* 027 | මිනිසුන් සහිත උණු වා බැලුන | 2 වග, උපලේ - 37 ව්‍යව | ඇමුණුම 01 |
| 22. | *ASN* 028 | ශ්‍රී ලංකාව තුළ පියසර පුහුණු පාලසක් පිහිටුවීම, මෙහෙයුම සහ නඩත්තු කිරීම | 2 වග, උපලේ - 37 ව්‍යව69 වග, | ඇමුණුම 01 |
| 23. | *ASN* 029 | ගුවන්ගත කාර්ය මෙහෙයුම්, විශේෂ ගුවන් සේවා කාර්යයන්, බැලුන් උත්සව සඳහා බලය පැවරීම | 2 වග, උපලේ - 37 ව්‍යව 81 සහ 85 වග, | ඇමුණුම 06 |
| 24. | *ASN* 030 | EGPWS ගෙනයාම අනිවාර්ය කිරීම | 2 වග, උපලේ - 37 ව්‍යව | ඇමුණුම 06 |
| 25. | *ASN* 031 | ශ්‍රී ලංකාව තුළට මෙහෙයුම් සිදුකරන ගුවන්යානා ක්‍රමිකරණය | 2 වග, උපලේ - 37 සහ 14 ව්‍යව | ඇමුණුම 06 |
| 26. | *ASN* 032 | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන්යානා සහ ශ්‍රී ලංකා AOC දරන්නෙකු/ පියසර පාසල් බලපත්‍ර දරන්නෙකු/ පෞද්ගලික මෙහෙයුම්කරු බලය පැවරුම් දරන්නෙකු විසින් මෙහෙයවනු ලබන විදේශ ලියාපදිංචි ගුවන් යානා තුළ CNS උපකරණ රැගෙන යාම | 2 වග, උපලේ - 37 ව්‍යව | ඇමුණුම 06 |
| 27. | *ASN* 033 | ගුවන් යානා ලියාපදිංචි කිරීම, ගුවන් යානා ජාතිකත්වය සහ ලියාපදිංචි කිරීමේ ලකුණු පිළිබඳ මාර්ගෝපදේශ | 2 වග, උපලේ - 37 සහ 17-21 ව්‍යව 39 - 47 වගන්ති | ඇමුණුම 07 |

| අනු අංකය | ASN අංකය | විෂය කරුණු | පනතට යොමුව | ඇමුණුම |
|---|---|---|---|---|
| 28. | ASN 034 | ගුවන් යානා අමතර කොටස් ආනයනය සහ අපනයනය | 2 වග, උපලේ - 37 ව්‍යව48, 49 සහ 74 වගන්ති, | ඇමුණුම 08 |
| 29. | ASN 035 | DGCA විසින් නිකුත් කරන ලද ගුවන් ප්‍රවාහණ සමාගම් බලපත්‍ර දරන්නන් විසින් දේශීය මගී ප්‍රවාහණ සේවා සඳහා සේවයෙහි යොදා ඇති පියසර පිරිස් සාමාජිකයින්ගේ, මැදිරි සේවක පිරිස් සාමාජිකයින්ගේ සහ මැදිරි භාරකරුවන්ගේ රාජකාරී කාලය, පියාසර කාලය සහ විවේක කාලසීමා සම්බන්ධ රාජ්‍ය සීමා පැනවීම් | 2 වග, උපලේ - 37 ව්‍යව | ඇමුණුම 06 |
| 30. | ASN 036 | පියසර පිරිස් බලපත්‍රයක් සහ ප්‍රමාණන වලංගු කිරීම සඳහාත්, විදේශ පියසර පිරිස් බලපත්‍ර සහ ප්‍රමාණන ශ්‍රී ලංකා පියසර පිරිස් බලපත්‍ර ප්‍රමාණන බවට පරිවර්තනය කිරීම සඳහාත් පොදු විධිවිධාන, අවශ්‍යතා සහ කාර්ය පටිපාටි | 2 වග, උපලේ - 32,37 සහ 40 ව්‍යව, 66 වග, | ඇමුණුම 01 |
| 31. | ASN 037 | ආනයනය පිණිස ගුවන්යානා පිළිගැනීම සඳහා මාර්ගෝපදේශ | 2 වග, උපලේ - 37 ව්‍යව74 වග, | ඇමුණුම 08 |
| 32. | ASN 039 | වාණිජ ගුවන් ප්‍රවාහණ මෙහෙයුම්වල නිරත වන ගුවන් යානා විසින් සම්පූර්ණ කළ යුතු සාමාන්‍ය අවශ්‍යතා | 2 වග, උපලේ - 37 ව්‍යව73, 78 සහ 116 වග, | ඇමුණුම 06 |
| 33. | ASN 041 | සිවිල් ගුවන් යානා තුළ දුම්බීම තහනම් කිරීම | ගු.සං.රෙ 244 | |
| 34. | ASN 042 | වාණිජ ගුවන් ප්‍රවාහණ මෙහෙයුම්වල නිරත වන ගුවන් යානා සඳහා මෙහෙයුම් අවශ්‍යතා | 2 වග, උපලේ - 37 ව්‍යව73 වග, | ඇමුණුම 06 |
| 35. | ASN 043 | බලය නොලත් පුද්ගලයින් පියසර කට්ටුවට පිවිසීම වැළැක්වීම සඳහා නිරුපද්‍රතතා සහ සුරක්ෂිතතා පියවර හඳුන්වා දීම | 2 වග, උපලේ - 37 ව්‍යව83 වග, | ඇමුණුම 06 |
| 36. | ASN 044 | වාණිජ ගුවන් ප්‍රවාහණ මෙහෙයුම් සඳහා යොදාගනු ලබන ගුවන් යානාවන්හි මෙහෙයුම් සීමා පැනවීම් | 2 වග, උපලේ - 37 ව්‍යව73 වග, | ඇමුණුම 06 |
| 37. | ASN 045 | වාණිජ ගුවන් ප්‍රවාහණ මෙහෙයුම්වල නිරත කෙරෙන ගුවන්යානා නඩත්තුව | 2 වග, උපලේ - 37 ව්‍යව92 වග, | ඇමුණුම 06 |
| 38. | ASN 046 | වාණිජ ගුවන් ප්‍රවාහණ මෙහෙයුම්වල ගුවන් යානා සංදේශන සහ නාවික උපකරණ | 2 වග, උපලේ - 37,28 සහ 30 ව්‍යව | ඇමුණුම 06 |
| 39. | ASN 047 | වාණිජ ගුවන් ප්‍රවාහණ මෙහෙයුම්වල නිරත වන ගුවන්යානා පියසර සේවක පිරිස් | 2 වග, උපලේ - 37 ව්‍යව70 වග, | ඇමුණුම 06 |
| 40. | ASN 048 | වාණිජ ගුවන් ප්‍රවාහණ මෙහෙයුම් සඳහා පියසර මෙහෙයුම් නිලධාරී / පියසර පිටත් කරවීමේ නිලධාරී | 2 වග, උපලේ - 37 සහ 66 ව්‍යව | ඇමුණුම 06 |

| අනු අංකය | *ASN* අංකය | විෂය කරුණු | පනතට යොමුව | ඇමුණුම |
|---|---|---|---|---|
| 41. | *ASN* 049 | වාණිජ ගුවන් ප්‍රවාහණ මෙහෙයුම් සඳහා භාවිතා කළ යුතු අත් පොත්, ලොග් පොත් සහ වාර්තා | 2 වග, උපලේ - 37 ව්‍යව | ඇමුණුම 06 |
| 42. | *ASN* 051 | වාණිජ ගුවන් ප්‍රවාහණ මෙහෙයුම් වල නිරත වී සිටින මැදිරි සේවක පිරිස් සාමාජිකයින් | 2 වග, උපලේ - 37 සහ 32 ව්‍යව | ඇමුණුම 06 |
| 43. | *ASN* 052 | වාණිජ ගුවන් ප්‍රවාහණ මෙහෙයුම් වලදී යොදන සුරක්ෂිතතාව | 2 වග, උපලේ - 37 ව්‍යව102 වග, | ඇමුණුම 06 |
| 44. | *ASN* 053 | වාණිජ ගුවන් ප්‍රවාහණ මෙහෙයුම් සඳහා අවශ්‍ය ගුවන් යානා මෙවලම්, උපකරණ සහ පියසර ලියකියවිලි | 2 වග, උපලේ - 37 ව්‍යව70 වග, | ඇමුණුම 06 |
| 45. | *ASN* 054 | පුද්ගල බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ අවශ්‍යතා-අර්ථ දැක්වීම් සහ සාමාන්‍ය රීති | 2 වග, උපලේ - 37 ව්‍යව66, 68 සහ 69 වග, | ඇමුණුම 01 |
| 46. | *ASN* 055 | පුද්ගල බලපත්‍ර නිකුත් කිරීමට අදාළ අවශ්‍යතා-ගුවන් නියමු බලපත්‍ර සහ ප්‍රමාණන | 2 වග, උපලේ - 37 සහ 32 ව්‍යව66 වග, | ඇමුණුම 01 |
| 47. | *ASN* 056 | පුද්ගල බලපත්‍ර නිකුත් කිරීමට අදාළ අවශ්‍යතා-පියසර නාවිකයින්, පියසර ඉංජිනේරු වරුන් හා පියසර ගුවන් විදුලි දුරකථන මෙහෙයුම් කරුවන් සඳහා බලපත්‍ර | 2 වග, උපලේ - 37 සහ 32 ව්‍යව66 වග, | ඇමුණුම 01 |
| 48. | *ASN* 057 | පුද්ගල බලපත්‍ර නිකුත් කිරීමට අදාළ අවශ්‍යතා-පියසර මෙහෙයුම් නිලධාරී / පියසර පිටත් කිරීමේ නිලධාරී බලපත්‍ර | 2 වග, උපලේ - 37 ව්‍යව69 වග, | ඇමුණුම 01 |
| 49. | *ASN* 058 | පුද්ගල බලපත්‍ර නිකුත් කිරීමට අදාළ අවශ්‍යතා - පුද්ගල බලපත්‍ර සඳහා පිරිවිතර සහ කාර්ය පටිපාටි | 2 වග, උපලේ - 37 ව්‍යව69 වග, | ඇමුණුම 01 |
| 50. | *ASN* 059 | පුද්ගල බලපත්‍ර නිකුත් කිරීමට අදාළ අවශ්‍යතා - බලපත්‍ර නිකුත් කිරීම සඳහා වෛද්‍ය විධිවිධාන | 2 වග, උපලේ - 37 ව්‍යව66 සහ 68 වග, | ඇමුණුම 01 |
| 51. | *ASN* 060 | ගුවන් යානා ශබ්ද සහතික නිකුත් කිරීම | 2 වග, උපලේ - 37 ව්‍යව | ඇමුණුම 16 |
| 52. | *ASN* 061 | සහතික නිකුත් කිරීමේ කාර්ය පටිපාටි සහ අඛණ්ඩ ගුවන් යෝග්‍යතාව | 2 වග, උපලේ - 31 සහ 37 ව්‍යව50 52 වග, | ඇමුණුම 08 |
| 53. | *ASN* 062 | හමුදා පියසර පළපුරුද්ද සලකා සිවිල් ගුවන් නියමු බලපත්‍ර නිකුත් කිරීම | 2 වග, උපලේ - 37 ව්‍යව69 වග, | ඇමුණුම 01 |
| 54. | *ASN* 063 | නියත අවරෝහණ අවසාන ලගාවීම (CDFA) නියත නොවන ලගාවීම් වෙනුවට ස්ථායී ලගාවීම | 2 වග, උපලේ - 37 ව්‍යව | ඇමුණුම 06 |
| 55. | *ASN* 065 | ගුවන් යෝග්‍යතා විධාන (AD) අනිවාර්ය නවීකරණ/පරීක්ෂණ | 2 වග, උපලේ - 37 ව්‍යව48 වග, | ඇමුණුම 08 |

| අනු අංකය | ASN අංකය | විෂය කරුණු | පනතට යොමුව | ඇමුණුව |
|---|---|---|---|---|
| 56. | *ASN* 066 | භූමිය පිළිබඳව මතක් කිරීමේ සහ අනතුරු ඇඟවීමේ පද්ධති (TAWS) භාවිතය සම්බන්ධ පුහුණු පාඨමාලා මෙහෙයුම් සම්බන්ධ මග පෙන්වීම් | 2 වග, උපලේ - 37 ව්‍යව | ඇමුණුම 06 |
| 57. | *ASN* 067 | පියසර තට්ටු සේවක පිරිස් සාමාජිකයින් සඳහා සම්මත මෙහෙයුම් කාර්ය පටිපාටි | 2 වග, උපලේ - 37 ව්‍යව | ඇමුණුම 06 |
| 58. | *ASN* 068 | සේවක පිරිස් - සම්පත් කළමනාකරණ පුහුණුව | 2 වග, උපලේ - 37 ව්‍යව | ඇමුණුම 06 |
| 59. | *ASN* 069 | පියසර පිරිස් සාමාජිකයින් සහ මැදිරි සේවක පිරිස් සාමාජිකයින් අතර සංදේශනය සහ සමායෝජනය | 2 වග, උපලේ - 37 ව්‍යව | ඇමුණුම 06 |
| 60. | *ASN* 070 | රේඛීය මෙහෙයුම් අනුකරණ රේඛා දිශාභිමුඛ පියසර පුහුණුව - විශේෂ කාර්ය මෙහෙයුම් පුහුණුව | 2 වග, උපලේ - 37 ව්‍යව | ඇමුණුම 06 |
| 61. | *ASN* 071 | පියසර පිටත් කිරීමේ නිලධාරී / පියසර මෙහෙයුම් නිලධාරී - සම්පත් කළමනාකරණ පුහුණුව | 2 වග, උපලේ - 37 ව්‍යව | ඇමුණුම 06 |
| 62. | *ASN* 072 | නිරුපද්‍රතතා අංශයක් පිහිටුවීම | 2 වග, උපලේ - 37 ව්‍යව | ඇමුණුම 06 |
| 63. | *ASN* 073 | පියසර දත්ත විශ්ලේෂණ (FDA) වැඩසටහන | 2 වග, උපලේ - 37 ව්‍යව70 වග, | ඇමුණුම 06 |
| 64. | *ASN* 074 | පියසර නිරුපද්‍රතතා ලේඛන පද්ධතියක් පිහිටුවීම | 2 වග, උපලේ - 37 ව්‍යව70 වග, | ඇමුණුම 06 |
| 65. | *ASN* 075 | මෙහෙයුම් කරුවන්ට තොරතුරු RNAV මත (GNSS) GPS මත පදනම් වූ නියත නොවන ලගාවීම් කාර්ය පටිපාටි | 2 වග, උපලේ - 37 ව්‍යව70 වග, | ඇමුණුම 06 |
| 66. | *ASN* 076 | ළගාවීමේ සහ ගොඩ බෑමේ අනතුරු අඩු කිරීම (ALAR) සහ පාලිත පියසර භූමියෙහි ගැටීම වැලැක්වීමේ (CFIT) පුහුණුව | | ඇමුණුම 06 |
| 67. | *ASN* 077 | අන්තරායකාරී ද්‍රව්‍ය ගුවනින් ප්‍රවාහණය කිරීම සම්බන්ධ කටයුතු | 2 වග, උපලේ - 37 ව්‍යව78 වග, | ඇමුණුම 18 |
| 68. | *ASN* 078 | ගුවන් යානා නිෂ්පාදකයින්ගේ වෙබ් අඩවියට පිවිසීම | | ඇමුණුම 06 |
| 69. | *ASN* 079 | ගුවන් යානා එන්ජින් මෝචන | 2 වග, උපලේ - 37 ව්‍යව48 වග, | ඇමුණුම 16 |
| 70. | *ASN* 080 | සාමාන්‍ය ගුවන් සේවා කාර්යයන්හි නිරත වන මෙහෙයුම් කරුවන් ශ්‍රී ලංකාව තුළට ඉන් පිටතට හෝ ශ්‍රී ලංකාව ඇතුළත හෝ මෙහෙයුම් සිදු කිරීම | 2 වග, උපලේ - 37 ව්‍යව72 සහ 73 වග, | ඇමුණුම 06 |

| අනු අංකය | ASN අංකය | විෂය කරුණු | පනතට යොමුව | ඇමුණුව |
|---|---|---|---|---|
| 71. | ASN 081 | වාණිජ ප්‍රවාහණ මෙහෙයුම් සදහා DGCA විසින් නිකුත් කරන ලද ගුවන් සේවා නිරුපද්‍රතතා නිවේදනයන්හි භාවිතා කර ඇති යෙදුම් සඳහා අර්ථ කථන | | ඇමුණුම 06 |
| 72. | ASN 082 | මැදිරි සේවක පිරිස් සාමාජික සහතික නිකුත් කිරීම - මෙහෙයුම් කරුවන්ට උපදෙස් | 2 වග, උපලේ - 37 සහ 32 ව්‍යව | ඇමුණුම 06 |
| 73. | ASN 083 | ගුවන් යානා නඩත්තු බලපත්‍ර සහ ගුවන් යානා වර්ග ප්‍රමාණන නිකුත් කිරීම සහ අළුත් කිරීම | 2 වග, උපලේ - 37 ව්‍යව66 සහ 67 වග, | ඇමුණුම 01 |
| 74. | ASN 084 | අනුමත නඩත්තු පුහුණු සංවිධාන (AMTO) පිහිටුවීම සහ මෙහෙයවීම | 2 වග, උපලේ - 37 ව්‍යව69 සහ 92 වග, | ඇමුණුම 08 |
| 75. | ASN 085 | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් යානා නඩත්තුව සඳහා පහසුකම් පිහිටුවීම | 2 වග, උපලේ - 37 ව්‍යව48 වග, | ඇමුණුම 08 |
| 76. | ASN 086 | ශ්‍රී ලංකා ගුවන් තලයට අදාළ ගුවනේ නීති | 2 වග, උපලේ - 12 සහ 37 ව්‍යව35 සහ 71 වග, | ඇමුණුම 02 |
| 77. | ASN 089 | මූලික RNAV (RNP-5) අනුමැතිය සඳහා අවශ්‍යතා | 2 වග, උපලේ - 37 ව්‍යව70 වග, | ඇමුණුම 06 |
| 78. | ASN 090 | ශ්‍රී ලංකාව තුළ ගගන නාවික තොරතුරු සේවා සැපයීම | 2 වග, උපලේ - 37 ව්‍යව11 වග, | ඇමුණුම 15 |
| 79. | ASN 091 | ශ්‍රී ලංකාව තුළ ගුවන් ගමන් සේවා සැපයීම | 2 වග, උපලේ - 28 සහ 37 ව්‍යව 79 වග, ANR 112 | ඇමුණුම 11 |
| 80. | ASN 092 | ශ්‍රී ලංකාවේ ATS සැපයුම්කරුවන් ගගන යාත්‍රාංගන මෙහෙයුම්කරුවන් ගුවන් යානා මෙහෙයුම් කරුවන් සහ ගුවන් යානා නඩත්තු සංවිධාන විසින් සම්පූර්ණ කළ යුතු නිරුපද්‍රතතා කළමනාකරණ අවශ්‍යතා | 2 වග, උපලේ - 37 ව්‍යව116 වග, | ඇමුණුම 08, 11 සහ 14 |
| 81. | ASN 093 | ගුවන් සහ භූමි මෙහෙයුම්වලදී භාවිතා කළ යුතු මිණුම් ඒකක | 2 වග, උපලේ - 28 (C)ව්‍යව(ANR) 278 | ඇමුණුම 05 |
| 82. | ASN 094 | අනුමත නඩත්තු සංවිධානයක් (145) පිහිටුවීම සඳහා අනුමැතිය | 2 වග, උපලේ - 37 ව්‍යව48 වග, | ඇමුණුම 08 |
| 83. | ASN 095 | අඩුකළ සිරස් වෙන්වීම් අවමයන් (RVSM) | 2 වග, උපලේ - 37 ව්‍යව70 වග, | ඇමුණුම 06 |
| 84. | ASN 096 | ශ්‍රී ලංකාව තුළ ගගන යාත්‍රාංගන සහතික කිරීම සඳහා වන අවශ්‍යතා | 2 වග, උපලේ - 37 සහ 68 ව්‍යව13,14,15 සහ 16 වග, | ඇමුණුම 14 |
| 85. | ASN 097 | ගුවන් යානා නඩත්තු බලපත්‍ර විභාගය (AML) පැවැත්වීම සහ AMEBL බලපත්‍රය AML බලපත්‍රයකට පරිවර්තනය කිරීම සඳහා වන පරිපාලනය කාර්ය පටිපාටි | 2 වග, උපලේ - 37 ව්‍යව66 වග, | ඇමුණුම 08 |

| අනු අංකය | ASN අංකය | විෂය කරුණු | පනතට යොමුව | ඇමුණුව |
|---|---|---|---|---|
| 86. | ASN 099 | ශ්‍රී ලංකාවේ ගගන යාත්‍රාංගන ප්‍රමිති | 2 වග, උපලේ - 37 සහ 68 ව්‍යව13,14,15,16, වග ANR 282 වග | ඇමුණුම 14 |
| 87. | ASN 100 | ගගන නාවික ප්‍රස්තාර සඳහා ප්‍රමිති | 2 වග, උපලේ - 28 සහ 37 ව්‍යව ANR -280 වග, | ඇමුණුම 04 |
| 88. | ASN 101 | ගුවන් විදුලි දුරකථන සංදේශයනට අවශ්‍ය භාෂා ප්‍රවීණතාව | 2 වග, උපලේ - 37 ව්‍යව66 වග, | ඇමුණුම 01 |
| 89. | ASN 102 | පියසර දත්ත වාර්තා සහ නියමු කුටි හඩපටි අංක සංශෝධනය | 2 වග, උපලේ - 37 ව්‍යව | ඇමුණුම 08 |
| 90. | ASN 103 | භූමි සමීපස්ථභාවය දැනුම් දීමේ පද්ධති (GPWS) උපකරණවල ප්‍රබලකර භාවය පවත්වාගෙන යාම | 2 වග, උපලේ - 37 ව්‍යව70 වග, | ඇමුණුම 06 |
| 91. | ASN 104 | ගුවනේ ගැටීම් වැළැක්වීමේ පද්ධති (ACAS) උපකරණ සඳහා මෙහෙයුම් කාර්ය පටිපාටි සහ පුහුණු අවශ්‍යතා පිළිබඳ මාර්ගෝපදේශ | 2 වග, උපලේ - 37 ව්‍යව70 වග, | ඇමුණුම 06 |
| 92. | ASN 105 | ජාත්‍යන්තර ගුවන් සංතරණය සඳහා ශ්‍රී ලංකාව තුළ කාලගුණ විද්‍යා සේවා සැපයීම | 2 වග, උපලේ - 28 (a) ව්‍යව ANR 238.5.3 | ඇමුණුම 03 |
| 93. | ASN 106 | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් යානා තුළ පාවිච්චි කරන හදිසි අවස්ථා සංඥා එළි (406 - MHZ) ලියාපදිංචි කිරීම | 2 වග, උපලේ - 37 ව්‍යව | ඇමුණුම 10 |
| 94. | ASN 107 | ගුවන් සංතරණ සේවා සහ ගගනයාත්‍රාංගන මෙහෙයුම් සඳහා අනිවාර්ය / ස්වේච්ඡා සිදුවීම් වාර්තා කිරීමේ ක්‍රමය | 2 වග, උපලේ - 37 ව්‍යව 53 සහ 54 වග, | |
| 95. | ASN 108 | ගුවන් සංතරණ සේවා සැපයීම සහ RCC/RSC, පිහිටුවීම | 2 වග, උපලේ - 37 ව්‍යව 53 සහ 54 වග, | ඇමුණුම 12 |
| 96. | ASN 109 | ටැක්සි මෙහෙයුම් අතරතුර පියසර සේවක පිරිස් කාර්ය පටිපාටි සඳහා මගපෙන්වීම් | | ඇමුණුම 06 |
| 97. | ASN 110 | ටැක්සි මෙහෙයුම් අතරතුර ඒකල නියමු කාර්ය පටිපාටි සඳහා මගපෙන්වීම් | | ඇමුණුම 06 |
| 98. | ASN 111 | පුද්ගල බලපත්‍ර නිකුත් කිරීමේ අවශ්‍යතා - ගගන නාවික ස්ථාන මෙහෙයුම්කරු | 2 වග, උපලේ - 37 ව්‍යව66 වග, | ඇමුණුම 01 |
| 99. | ASN 112 | පුද්ගල බලපත්‍ර නිකුත් කිරීමේ අවශ්‍යතා - ගුවන් ගමන් පාලක වරුන් සඳහා බලපත්‍ර සහ ප්‍රමාණන | 2 වග, උපලේ - 37 ව්‍යව66 වග, | ඇමුණුම 01 |
| 100. | ASN 113 | ගගන නාවික විදුලි සංදේශන - ශ්‍රී ලංකාවේ සංදේශන කාර්ය පටිපාටි | 2 වග, උපලේ - 28 (6) ව්‍යව, 11 වග, ANR 99 - 105 | ඇමුණුම 10 |

| අනු අංකය | ASN අංකය | විෂය කරුණු | පනතට යොමුව | ඇමුණුව |
|---|---|---|---|---|
| 101. | ASN 114 | ගගන නාවික විදුලි සංදේශන - ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි සංතරණ ආධාරක | 2 වග, උපලේ - 28 (a) ව්‍යව, 11 වග, ANR 99 - 105 | ඇමුණුම 10 |
| 102. | ASN 115 | ගගන නාවික විදුලි සංදේශන - සංදේශන ක්‍රම - I කොටස - ශ්‍රී ලංකාවේ සංඛ්‍යාංක දත්ත සංදේශන පද්ධති | 2 වග, උපලේ - 28 (ඉ) ව්‍යව, 11 වග, ANR 99 - 105 | ඇමුණුම 10 |
| 103. | ASN 116 | ගගන නාවික විදුලි සංදේශන - සංදේශන ක්‍රම - II කොටස - ශ්‍රී ලංකාවේ හඬ සංදේශන පද්ධති | 2 වග, උපලේ - 28 (ඉ) ව්‍යව, 11 වග, ANR 99 - 105 | ඇමුණුම 10 |
| 104. | ASN 117 | ගගන නාවික විදුලි සංදේශන - ගගන නාවික ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලී උපයෝගීකරණය | 2 වග, උපලේ - 28 (a) ව්‍යව, 11 වග, ANR 99 - 105 | ඇමුණුම 10 |
| 105. | ASN 118 | සෝදිසි සහ ගැටීම් වැළැක්වීමේ පද්ධතිය | 2 වග, උපලේ - 28 ව්‍යව, 11 වග, ANR 99 - 105 | ඇමුණුම 10 |
| 106. | ASN 119 | වාණිජ ගුවන් ප්‍රවාහණ මෙහෙයුම්වල නිරත වන ගුවන් යානා - බඳු සහ කුලී මෙහෙයුම් | 2 වග, උපලේ - 37 ව්‍යව77 වග, | ඇමුණුම 06 |
| 107. | ASN 120 | ගුවන් යානා කොටස්වල විශ්වාස බව සහ සේවා යෝග්‍යතාව | 2 වග, උපලේ - 37 ව්‍යව48 වග, | ඇමුණුම 08 |
| 108. | ASN 121 | මෙහෙයුම් සේවක පිරිසට අදාළ ලිපිලේඛන, උපකරණ, අංක සහ විස්තර | 2 වග, උපලේ - 29 සහ 37 ව්‍යව70 වග, | ඇමුණුම 06 |
| 109. | ASN 122 | ගුවන් නියමු බලපත්‍ර අඛණ්ඩ වලංගුතාව පවත්වා ගැනීම, අළුත් කිරීම සහ ප්‍රතිසක්‍රියනය, (ගුවන්යාන, හෙළිකොප්ටර්, බලය යෙදූ පායාන, ගුවන් නැව්, බැලූන් සහ නිසර්පණ යානා) සහ ප්‍රමාණන | 2 වග, උපලේ - 32,37 සහ 40 ව්‍යව 66 වග, | ඇමුණුම 01 |
| 110. | ASN 123 | වාණිජ සහ සාමාන්‍ය ගුවන් සේවා මෙහෙයුම්වල නිරතවන හෙලිකොප්ටර් | 2 වග, උපලේ - 37 ව්‍යව, | ඇමුණුම 06 |
| 111. | ASN 124 | ශ්‍රී ලංකාවේ සෙවීමේ සහ මුදාගැනීමේ මෙහෙයුම් ප්‍රමිති | 53,54 වග, උපලේ - 16 සහ 25 ව්‍යව, 11 වග, | ඇමුණුම 12 |
| 112. | ASN 125 | ශ්‍රී ලංකාව තුළ ගුවන් සේවා කාළගුණ විද්‍යා සේවාව සැපයීම | 2 වග, උපලේ - 28 (a) ව්‍යව | ඇමුණුම 03 |
| 113. | ASN 127 | නිරුපද්‍රතතා පුහුණු උපදේශක වරුන් සහ නිරුපද්‍රතතා පුහුණු වැඩසටහන් | | |
| 114. | ASN 129 | විදේශ රාජ්‍යයන්ට අයත් ගුවන් තලයෙහි පියාසර කරන විට අතර මග බාධා කිරීමක් වූ අවස්ථාවක උපදෙස් අනුගමනය කිරීමේ අවශ්‍යතා | 2 වග, උපලේ - 3 Bis ව්‍යව11 සහ 33 වග, | ඇමුණුම 02 සහ 11 |

## 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනත

### ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් : පියසර නිරුපද්‍රිතතා ලේඛන පද්ධතිය

සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල්, එච්. එම්. සී. නිමල්සිරි වන මම, 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනතේ 120 (1) වගන්තිය ප්‍රකාරව මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් මින් නිකුත් කරමි.

එච්. එම්. සී. නිමල්සිරි
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්
සහ ප්‍රධාන විධායක නිලධාරී

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,
64, ගාලු පාර,
කොළඹ 03.

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

**ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති**

(2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනතේ 120 වගන්තිය ප්‍රකාර නිකුත් කරන ලදී.)

**මාතෘකාව : පියසර නිරුපද්‍රතා ලේඛන පද්ධතිය**

යොමු අංකඃ CA-IS-2010-OPS-001 අනු අංකය : IS-002 දිනය : 2010 නොවැම්බර් 28

2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනතේ 120 වගන්තිය ප්‍රකාර, එසේ කිරීම අවශ්‍ය බව හෝ උචිත බව හෝ අදහස් කරන අවස්ථාවක, පනතට අයත් උපලේඛනයෙහි නියම කර ඇති ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සම්මුතියෙහි ව්‍යවස්ථා ද ඇතුළුව සිවිල් ගුවන් සේවා පනතේ විධිවිධාන කිසිවක් හෝ ඒ යටතේ පනවන ලද රෙගුලාසි කිසිවක් හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති නිකුත් කිරීමට සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්ට බලය හිමි විය යුතුය.

ඒ අනුව, පහත අත්සන් තබන මම, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් මීට යා කොට ඇති ඇමුණුමෙහි නිශ්චය කොට ඇති, ඉහත කී පනතේ විධිවිධාන සහ සම්මුතියෙහි 37 ව්‍යවස්ථාවෙහි විස්තර කර ඇති ප්‍රමිති සහ කාර්ය පටිපාටි බලාත්මක කිරීම සඳහා එකී ඇමුණුමෙහි (යොමු අංක : CA-IS-2010-OPS-002-Att 01) සඳහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති මෙයින් නිකුත් කරමි

මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති වහාම ක්‍රියාත්මක වන පරිදි බලාත්මක විය යුතු අතර අවලංගු කරන තෙක් බලාත්මකව පැවතිය යුතුය.

වෙනත් කරුණු අතර, ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති සමඟ අනුවෘත්‍යය පැවැත්වීම පැහැර හැරීම වරදක් බව සඳහන් වන, පනතේ 103 වගන්තිය කෙරෙහිද මෙහිදී අවධානය යොමු කරවමි.

එච්. එම්. සී. නිමල්සිරි
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්
සහ ප්‍රධාන විධායක නිලධාරී

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,
64, ගාලු පාර,
කොළඹ 03.

මේ සමග ඇමුණුම් අංක : CA-IS-2010-OPS-001-Att-01

**ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති : CA-IS-2010-OPS-001**

මාතෘකාව : පියසර නිරුපද්‍රතතා ලේඛන පද්ධතිය

1. චිකාගෝ සම්මුතියේ 6 ඇමුණුම - 1 කොටසේ හා 3:3:1 ඡේදය ප්‍රකාර මෙහෙයුම්කරුවකු විසින්, මෙහෙයුම් කටයුතුවල නිරත වන පුද්ගලයින්ට මග පෙන්වීම පිණිස පියසර නිරුපද්‍රතතා ලේඛන පද්ධතියක් පිහිටුවනු ලැබිය යුතුය.

2. පියසර නිරුපද්‍රතතා ලේඛන පද්ධතිය යනු මෙහෙයුම්කරුවකු විසින් පියසර සහ භූමි මෙහෙයුම්වලදී අවශ්‍ය වන තොරතුරු පිළිවෙලට සංවිධානය කරමින් සම්පාදනය කරනු ලබන අවම වශයෙන් මෙහෙයුම් අත්පොත සහ මෙහෙයුම්කරුගේ නඩත්තු පාලන අත්පොත ඇතුලත් වන අන්‍යෝන්‍ය සම්බන්ධතාවකින් යුක්ත ලේඛන එකතුවකි මීට SOP, මැදිරි සේවක පිරිස් අත්පොත, පුහුණු අත්පොත්, නඩත්තු පාලන අත්පොත හදිසි අවස්ථා ප්‍රතිචාර සැලැස්ම සහ සුරක්ෂිතතා අත්පොත යනාදිය ඇතුළත් විය හැකිය.

3. මෙම අත්පොත් අතර පහත සඳහන් අසමතා පැවතිය හැකිය.

   (අ) කතෘවරුන් වෙනස් විය හැකිය
   (ආ) වෙනත් වගකීම් යටතේ පැවතිය හැකිය
   (ඇ) විවිධ වූ පාරිභාෂික්‍ය භාවිතා කර තිබිය හැකිය
   (ඈ) ආකෘතිය වෙනස් විය හැකිය, එසේත් නැතහොත්
   (ඉ) ව්‍යුහය වෙනස් විය හැකියි එසේත් නැතහොත්
   (එ) එකිනෙක සමඟ ගැලපුම හෝ සංගතිය හෝ නොමැති විය හැකිය

   එහෙයින් මෙහෙයුම්කරු විසින්, මධ්‍යගත ලේඛන පද්ධතියක් මගින් මෙම අත්පොත් අතර ගැලපුම සහ සංගතිය පවත්වා ගැනීමට සම්මත ප්‍රයත්නයක් දරණු නොලැබුවහොත් ක්‍රියාත්මක කිරීමේදී අසංස්ථිතික තත්ත්වයන්ට සහ ව්‍යාකූල තත්ත්වයන්ට මුහුණ පෑමට සිදු වනු ඇත.

4. මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියෙහි කාර්යය වනුයේ පියසර නිරුපද්‍රතතා ලේඛන පද්ධතිය පිහිටුවීමේදී මෙහෙයුම්කරුවකු අනුගමනය කළ යුතු අවශ්‍යතා නිශ්චය කිරීම ය.

5. අවශ්‍යතා : සෑම මෙහෙයුම් කරුවෙක්ම පහත සඳහන් අංග ලක්ෂණයන්ගෙන් යුක්ත පියසර නිරුපද්‍රතතා ලේඛන පද්ධතියක් පිහිටුවන බවට සහතික විය යුතුය.

   **(අ) පද්ධති මූලධර්ම**

   මෙහෙයුම් කරුවකු විසින් නිකුත් කරනු ලබන සෑම එකිනෙක අත්පොතකම -

   1. සමාන ව්‍යුහයක් තිබිය යුතුය
   2. පොදු පාරිභාෂික වචන මාලාවක් තිබිය යුතුය
   3. අදාල වන තොරතුරු ඇතුළත් විය යුතුය

   **(ආ) තොරතුරු**

   මෙහෙයුම් කරුගේ එකිනෙක අත්පොත්වල ඇතුළත්වන තොරතුරු කාලය අනුව පහත සඳහන් පරිදි වර්ගීකරණය කරනු ලැබිය යුතුය.

   1. කාල සංවේදී තොරතුරු
   2. කාලය සීමිත තොරතුරු
   3. නිසි කල්හි සැපයෙන තොරතුරු

(ඇ) පද්ධති යන්ත්‍රණය

මෙහෙයුම්කරු පහත සඳහන් කාර්යයන් ඉටු වන බවට වග බලා ගැනීමෙන් මේ සඳහා උචිත යන්ත්‍රණයක් පිහිටු විය යුතුය.

1. අඛණ්ඩ පදනමක් මත සියලුම අදාල පුද්ගලයින් අතර තොරතුරු බෙදා හැරීම.
2. සියලුම අදාල පුද්ගලයින් අතර තොරතුරු සමායෝජනය කිරීම.
3. අත්පොත්වල හෝ ලේඛනවල හෝ වෙනස්කම් සිදුකරන විට එකී වෙනස්කම් වලින් ආවේදනය විය හැකි පුද්ගලයින් සමඟ එකී වෙනස් කම් සමායෝජනය කිරීම.
4. යෝජිත වෙනස්කම් හේතුවෙන් බලපෑම් ඇතිවිය හැකි වෙනත් අත්පොත් හෝ ලේඛන හෝ හඳුනා ගැනීම සහ එකී වෙනස්කම් එවැනි අත්පොත් සමඟ සමායෝජනය කිරීමෙන් එවැනි අත් පොත්වල ද අනුෂංගික සංශෝධන සිදු කිරීම.
5. යල් පැන ගිය තොරුතුරු නිසි කල්හි පද්ධතියෙන් ඉවත් කිරීම.
6. පහසු සහ ව්‍යාකූල නොවන ලේඛන හැඳින්වීමේ (යොමු කිරීමේ) ක්‍රමයක් ඇති කිරීම.
7. අත්පොත් / ලේඛනවල භාවිතා කෙරෙන යෙදුම් සම්බන්ධ අර්ථකථන සහ සංක්ෂිප්ත යෙදුම් ඇතුල් කිරීම.
8. දැනට සංසරණයෙහි පවතින අත්පොත්/ලේඛන යාවත් කාලීන/කිරීමේ පහසුව.
9. පෙර යාවත්කාලීන කිරීම් බලාගැනීම සඳහා බලාත්මකව පවතින පිටු ලැයිස්තුව, සංශෝධන වාර්තාව සහ සංශෝධන ඉතිහාසය ආදිය ඇතුළත් විය හැකි ලුහු බැඳීමේ ක්‍රමයක් උපයෝජ්‍ය වශයෙන් තිබීමට සැලැස්වීම.

(ඈ) ප්‍රධාන අත්පොත් ලේඛනය

සෑම එකිනෙක මෙහෙයුම් කරුවෙක්ම අවම වශයෙන් අත්පොත් / ලේඛන පිළිබඳ පහත සඳහන් තොරතුරු ඇතුළත් ප්‍රධාන අත්පොත් ලේඛනයක් පවත්වාගෙන යා යුතුය.

1. යොමු අංකය
2. මාතෘකාව
3. මුද්‍රණයේ වර්ෂය
4. වෙළුමේ අංකය
5. අත්පොතේ කාර්යය
6. අවසාන සංශෝධනයේ දිනය
7. ලබන්නන්ගේ ලැයිස්තුව
8. සංශෝධන සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරියා/අංශය

6. සෑම එකිනෙක මෙහෙයුම් කරුවෙක්ම මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිය ලැබුනු දින සිට දින 30 ක් ඇතුළත තමන්ගේ පියසර නිරුපද්‍රතතා ලේඛන පද්ධතිය පිළිබඳ විස්තර සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත සැපයිය යුතුය. AOC අයදුම් කිරීමට බලපොරොත්තුවන තැනැත්තන් ද ඔවුන්ගේ පියසර නිරුපද්‍රතතා ලේඛන පද්ධති පිළිබඳ විස්තර අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේදී DGCA වෙත ඉදිරිපත් කළ යුතුය.

07-467/2

---

## 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනත

### ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් : ගගන හා භූමි මෙහෙයුම්වලදී භාවිතා කිරීම සඳහා ප්‍රමාණන ඒකක

සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්, එච්. එම්. සී. නිමල්සිරි වන මම, 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනතේ 120 (1) වගන්තිය ප්‍රකාරව මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් මින් නිකුත් කරමි.

එච්. එම්. සී. නිමල්සිරි,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්
සහ ප්‍රධාන විධායක නිලධාරී.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,
64, ගාලු පාර,
කොළඹ 03.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

**ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති**

(2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනතේ 120 වගන්තිය ප්‍රකාර නිකුත් කරන ලදී.)

**මාතෘකාව : ගුවන් සහ භූමි මෙහෙයුම්වලදී භාවිතා කළයුතු මිණුම් ඒකක**

යොමු අංක : CA-IS-2011-GEN-001 අනු අංකය : IS-003 දිනය : 2011 අප්‍රේල් 28

1. මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන්ට යොමු කළ යුත්තේ එහි යොමු අංකය, අනුක්‍රමික අංකය සහ ඉහත දැක්වෙන දිනයද සමඟ එහි මාතෘකාව සඳහන් කරමින්ය.

2. අංක CA-IS-2010-GEN-001 දරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියට අයත් ඇමුණුම - 01 හි 82 ඡේදයෙහි, සම්මුතියේ 5 ඇමුණුම - "**ගුවන් සහ භූමි මෙහෙයුම්වලදී භාවිතා කළයුතු මිණුම් ඒකක**'' දේශීය වශයෙන් ක්‍රියාත්මක කිරීමේදී පිළිපැදිය යුතු අවශ්‍යතා නියම කෙරෙන ගුවන් සේවා නිරුපද්‍රතතා නිවේදන (ASN) අංක 093 පිළිබඳව සඳහන් වේ.

3. මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති එකී අංක ASN - 093 දරණ ගුවන් සේවා නිරුපද්‍රතතා නිවේදන අභිභවා යමින් ගුවන් සහ භූමි මෙහෙයුම්වලදී භාවිතා කළ යුතු මිණුම් ඒකක නියම කරයි. ASN 093 අභාවිත තත්ත්වයේ පවතින බව සැළකෙන අතර එය යළිත් නිකුත් කිරීමක් සිදු නොවනු ඇත.

4. මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියේ විෂය කරුණට අදාළ වන නෛතික විධිවිධාන පහත සඳහන් පරිදි වේ

   (අ) 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනතේ 2 වගන්තිය.
   (ආ) 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනතේ උපලේඛනයෙහි 28(C) ව්‍යවස්ථාව
   (ඇ) ගුවන් සංතරණ රෙගුලාසි අංක 278
   (ඈ) 2001 අංක 01 දරණ සිවිල් ගුවන් සේවා අතුරු රෙගුලාසි
   (ඉ) ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සම්මුතියෙහි 5 - ඇමුණුම

5. ශ්‍රී ලංකා ගුවන් අවකාශය සහ කොළඹ පියසර තොරතුරු කලාපයට අයත් සාගරික ගුවන් අවකාශය ඇතුළත සිදුකරනු ලබන ගුවන් සහ භූමි මෙහෙයුම්වල සියලුම අංශයන්හි දී, මෙහි ඇමුණුමට අයත් 1 සටහනෙහි දක්වා ඇති මිණුම් ඒකක යෝග්‍ය පූර්වාක්ෂර සහ සංකේත සමඟ භාවිතා කළ යුතුය.

6. ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් යානා විදේශ ගුවන් අවකාශය ඇතුළත මෙහෙයුම් සිදුකරන විට ගුවන් යානයෙහි අණ දෙන නියමුවා ඒ ඒ ගුවන් අවකාශයෙහි පාලන බලය ඇති රාජ්‍යයන් විසින් නියම කරන ලද අවශ්‍යතා හෝ අදාළ කලාපීය ගුවන් සංතරණ සැලසුම් තුළ නියම කර ඇති අවශ්‍යතා හෝ පිළිපැදිය යුතුය. මේ දෙකින් එකකුදු නොමැති අවස්ථාවක මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියෙහි නියමිත අවශ්‍යතා පිළිපැදිය යුතුය.

7. SL ඒකකයන්හි දශම ගුණාකාර සහ උප ගුණාකාර සඳහා හැඳින්වීමේ නාම සහ සංකේත සකස් කිරීමේදී ඇමුණුමෙහි 2 සටහනෙහි ලැයිස්තු ගත කර ඇති පූර්වාක්ෂර සහ සංකේත භාවිතා කළ යුතු ය.

8. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සම්මුතියෙහි 5 ඇමුණුම ''**ගුවන් සහ භූමි මෙහෙයුම්වලදී භාවිතා කළ යුතු මිණුම් ඒකක**'' ට අයත් යා කිරීම් (Attachments) මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියෙහි කොටසක් විය යුතු අතර එකී යාකිරීම් මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියෙහි විධිවිධාන ක්‍රියාත්මක කරන විට මාර්ගෝපදේශයක් වශයෙන් භාවිතා කළ යුතුය.

9. මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිය වහාම ක්‍රියාත්මක වන පරිදි බලාත්මක විය යුතු අතර නැවත දැනුම් දෙන තුරු එසේ බලාත්මකව පැවතිය යුතුය.

මේ සමග ඇති ඇමුණුම් අංක : CA-IS-2011-GEN-001-Att-01

එච්. එම්. සී. නිමල්සිරි,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්
සහ ප්‍රධාන විධායක නිලධාරී.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,
අංක 4, හුණුපිටිය පාර,
කොළඹ 02.

**සම්මතයන් භාවිතයේ යෙදවීම : සී එ-අයි එස්-2011-පොදු-001**

ගුවන් සහ භූමි මෙහෙයුම් සඳහා භාවිතා කරනු ලබන මිනුම් ඒකක

*නිර්වචනය :*

* **ඇම්පියරය** (A) :

ඇම්පියරය යනු අනන්ත දිගැති, සරල රේඛීය, නොසැලකිය හැකි තරම් වූ වෘත්තාකාර හරස්කඩකින් යුක්ත වූ විද්‍යුත් සන්නායක 02 ක්, එකිනෙකට සමාන්තරව මීටර් 01ක පරතරයක් සිටින සේ තබා ඇති විට, එම සන්නායක 02 අතර අතිවෙන බලය නිව්ටන් 01ක් වනසේ සන්නායකය තුළ පවත්වාගත යුතු ධාරාවකි.

* **බෙකරල්** (□□) :

විකිරණ ශීලි න්‍යෂ්ටියක, තත්පර එකකට එක බැගින් සිදුවන න්‍යෂ්ටික ක්ෂයවීමකි.

* **කැන්ඩෙලාව** (cd) :

අඳුරු වස්තුවක, වර්ග මීටර 1/600,000ක මතුපිට වර්ගඵලයක් මගින්, වර්ග මීටරයට නිව්ටන් 101,325ක පීඩනයක් සහ ප්ලැටිනම් හි සිමාංකයේදී ඇතිවන ද්විතතා තීව්‍රතාවයයි.

* **සෙල්සියස් උෂ්ණත්වය** (toc) :

තාප ගති විද්‍යාවේදී සෙල්සියස් උෂ්ණත්වය $t^0c = T - To$ ලෙස කෙල්වින් උෂ්ණත්ව ඒකකය හා සම්බන්ධ වේ. T යනු දෙන ලද කෙල්වින් උෂ්ණත්වයක් වන අතර, To යනු කෙල්වින් 275.15 කී

* **කූලෝමය** (C) :

ඒකීය ඇම්පියරයක විද්‍යුත් ධාරාවක් මගින්, ඒකීය කාල පරාසයකදී සන්නායකයක් තුළින් ගමන් ගන්නා ආරෝපණ ප්‍රමාණය

* **සෙල්සියස් අංශය** ($^0$C) :

සෙල්සියස් පරිමාණයෙන් උෂ්ණත්වය මනින විට භාවිතා කරන නමයි.

* **ෆැරඩ්** (F) :

ධාරිත්‍රකයක තහඩු 02ක් අතර වෝල්ට් -01ක විභව අන්තරයක් සහ කූලෝම් 01ක විද්‍යුත් ආරෝපණයක් පවත්වා ගැනීමේදී දක්වෙන ධාරිතාවයි.

* **අඩිය** (Ft) :

මීටර් 0.3048 ක දිගකි.

* **ග්‍රේ** (Gy) :

අයණීකරණය විකිරණශීලතාවය මගින් යම් වස්තුවකට, කිලෝග්‍රෑමයට ජූල් 01ක ශක්තියක් ලබාදීමේදී උරා ගන්නා ශක්තියයි.

* **හෙන්රි** (H) :

සංවෘත විද්‍යුත් ධාරා පරිපථයක, තත්පරයට ඇම්පියර් 01ක ඒකාකාර සීඝ්‍රතාවයකින් ධාරාව වෙනස් වීමේදී වෝල්ට් 01ක විද්‍යුත් ගාමක බලයක් උපදවන ප්‍රේරතාවය හෙන්රි 01කි.

* **හර්ට්ස් (Hz) :**

ආවර්ථ කාලය තත්පර 01ක් වන සංසිද්ධියක සංඛ්‍යාතයයි.

* **මිනිස් ක්‍රියාකාරීත්වය :**

ආරක්ෂිත සහ කාර්යක්ෂම ගුවන් යාන්ත්‍රික මෙහෙයුම සඳහා බලපෑමක් ඇතිවන මිනිස් හැකියාවන් සහ සීමාවන්.

* **ජූලය (J) :**

නිවුටන 01ක විශාලත්වයක් ඇති බලයක්, බලය යොමු දිශාවටම මීටර 01ක් දුරක් චලනය වීමේදී කරන ලද කාර්යය ප්‍රමාණයයි.

* **කෙල්විනය (K) :**

ජලයේ ත්‍රික ලක්ෂයෙන් 1/273.16ක භාගයක් වන තාප ගති විද්‍යාවේ එන උෂ්ණත්වය මනින ඒකකයකි.

* **කිලෝ ග්‍රෑමය (kg) :**

ජාත්‍යන්තර සම්මත ස්කන්ධ ඒකක 01කට සමාන, ස්කන්ධ මනින ඒකකයකි.

* **නාවික සැතැප්ම (kt) :**

පැයට නාවික සැතැප්ම එකක වේගයයි.

* **ලීටර (L) :**

ඒකීය සහ ඩෙසි මීටරයක සමාන ද්‍රව සහ වායු පමණක් මිනුම් කරන ඒකකයකි.

* **ලුමෙන් (lm) :**

කැණ්ඩලා 01ක ඒකාකාර තීව්‍රතාවයකින් යුත්, ලක්ෂීය ප්‍රභවයකින් එක් ස්ටරේඩියනයක ඝන කෝණයක් හරහා නිකුත් වන දීප්තතා ස්‍රාවය.

* **ලක්ස් (lr) :**

ලුමෙන් 01ක ඒකාකාර දීප්තතා ස්‍රාවයකින් වර්ගමීටරයක් හරහා නිකුත්වන ප්‍රදීප්තතාවයයි.

* **මීටරය (m) :**

තත්පරයකින් 11299792458ක කොටසක් තුළදී රික්තයක් තුළදී ආලෝකය ගමන් කරන දුර.

* **මෞලය (mol) :**

□□12 සමස්ථානිකයේ කිලෝ ග්‍රෑම් 0.012ක ස්කන්ධයක් තුළ ඇති පදාර්ථයේ කුඩාම අංශු ප්‍රමාණයයි.

සටහන :මෞලය භාවිතා කිරීමේදී මූලික අංශුන් සඳහන් කළ යුතු අතර ඒවා පරමාණු අනු අයන ඉලෙක්ට්‍රෝන හෝ එම අංශුන්ගෙන් සැදුම්ලත් කාණ්ඩ වශයෙන් විය හැක.

* **නාවික සැතැප්ම (NM) :**

මීටර් 1852ක දිගකි.

* **නිවුටන් (N) :**

ඒකීය ස්කන්ධයකට, තත්පර වර්ගයට මීටර 01ක ත්වරණයක් ලබාදීමට යෙදිය යුතු බලය නිවුටන් 01කී

* **ඕම් (Ω) :**

වෝල්ට් 01ක නියත විභව අන්තරයක් සන්නායකයක දෙකෙළවර පවත්වාගත් විට, එම සන්නායකය තුළින් ගලන ධාරාව ඇම්පියර 01ක් වන විට (සන්නායකය වි. ගාමක බල ජනනය නොකරන) එම දෙකෙළවර ප්‍රතිරෝධය ඕම් 01කි.

* **පැස්කල් (Pa) :**

වර්ග මීටරයට නිවුටන් 01ක පීඩනය හෝ ආතැතිය.

* **රේඩියන් (rad) :**

වෘත්තයක අරයන් 02ක් අතර ඇතිවන චාපයේ දිගද අරයට සමාන වන සේ එම වෘත්තයේ කේන්ද්‍රයේ ඇති කරන තල කෝණයයි.

* **තත්පරය (s) :**

සීසියම් 133 භූමි මට්ටමේ පරමාණුවක, අධි ශක්ති මට්ටම් 2ක් අතර ශක්ති හුවමාරුවට අදාළව ඇතිවන විකිරණශීලිතාවයේ ආවර්ත 9192631770ක් සඳහා ගතවන කාල පරාසය තත්පර 01කි.

* **සීමන්ස් (S) :**

විභව අන්තරය වෝල්ට් 01ක් යටතේ, ඇම්පියර් 01ක ධාරාවක් ගලායන විට, සන්නායකයක සන්නායකතාවයයි.

* **සීවර්ට් (Sv) :**

කිලෝ ග්‍රෑමයක ජූල් 01ක ශක්‍යතාවයකට සමාන වනසේ ඇති විකිරණශීලිතාවය මනින ඒකකයකි.

* **ස්ටරේඩියන් (Sr) :**

මුදුන් ශීර්ෂය ගෝලයේ කේන්ද්‍රයේ පිහිටන ලෙස ද, ගෝලයේ මතුපිට පෘෂ්ටයේ එහි අරයේ වර්ගයට සමාන වර්ගඵලයක් ආපාතනය කරන සේ, ගෝලයක කේන්ද්‍රයේ ඇතිවන ඝන කෝණයයි.

* **ටෙස්ලාව (T) :**

වර්ග මීටරයට වෙබර් 01ක චුම්බක ස්‍රාවය මගින් දෙනු ලබන චුම්බක ස්‍රාව ඝනත්වයයි.

* **ටොනය (T) :**

කිලෝ ග්‍රෑම් 1000කට සමාන ස්කන්ධයකි.

* **වෝල්ට් (v) :**

සන්නායකයක දෙකෙළවර අතර ඇම්පියර් 01ක නියත විද්‍යුත් ධාරාවක් ගලා යාමේදී, එම අග්‍ර දෙක අතර ක්ෂමතාවය 1W වන පරිදි, සන්නායකයේ දෙකෙළවරට යෙදෙන විද්‍යුත් විභව අන්තරය හෝ විද්‍යුත් ගාමක බලය වෝල්ට් 01කි.

* **වැට් (W) :**

තත්පරයට ජූල් 01ක සීඝ්‍රතාවයකින් ශක්තිය නිපදවීම වැඩි කිරීමට යෙදිය යුතු බලයේ ප්‍රමාණයකි.

* **වෙබර් (Wb) :**

වෘත්තාකාර සන්නායක දඟරයක එක් සංවෘත පුඩුවක් (දඟරයක්) හරහා තත්පරයට වෝල්ට් 01ක සීඝ්‍රතාවයකින් විද්‍යුත් ගාමක බලයක් ජනිත කිරීමට අවශ්‍යය විද්‍යුත් චුම්භක ස්‍රාවයයි.

**විශේෂිත මිනුම් ඒකකවල සම්මත භාවිතයන්**

ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවාවේදී ගුවන් සහ ගොඩබිම් මෙහෙයුම් සඳහා භාවිතා කරනු ලබන මිනුම් සඳහා ඒකක පහත වගුව 01 හි දක්වා ඇත.

| අනු අංකය | රාශිය | ඒකකය |
|---|---|---|
| 1 | **දිශාව/අවකාශය/කාලය** | |
| 1.1. | උන්නතාංශය | අඩි |
| 1.2. | වර්ගඵලය | වර්ග මීටර් |
| 1.3. | දුර (දිගු) | නාවික හැතැප්ම |
| 1.4. | දුර (කෙටි) | මීටර් |
| 1.5. | උස් මට්ටම | අඩි |
| 1.6. | දරා ගැනීම | පැය සහ විනාඩි |
| 1.7. | උස | අඩි |
| 1.8. | අක්ෂාංශක | o, ’ , ” |
| 1.9. | දිග | මීටර් |
| 1.10. | දේශාංෂක | o, ‘ , “ |
| 1.11. | තල කෝණය | o |
| 1.12. | ධාවන පථ දිග | මීටර් |
| 1.13. | ධාවන පථයේ පෙනෙන දුර | මීටර් |
| 1.14. | ටැංකියේ ධාරිතාවය (ගුවන් යානය) | ලීටර් |
| 1.15. | කාලය<br>විනාඩි<br>පැය<br>දවස්<br>සති<br>මාස<br>අවුරුදු | තත්පර |
| 1.16. | පැහැදිළිව පෙනෙන දුර ප්‍රමාණය ද | කිලෝ මීටර් |
| 1.17. | පරිමාව | ඝන මීටර් |
| 1.18. | සුළඟේ දිශාව<br>ගුවන් ගත වීම් ගොඩ බැස්සවීම් හැරුණු විට සුළඟේ දිශාව අංශකවලින් ප්‍රකාශ වන අතර ගුවන් ගත වීම් සහ ගොඩ බැස්සවීම් සඳහා එය චුම්භක දිශා අංශකවලින් කියැවේ. | o |
| 2 | **ස්කන්ධය - අදාලව ඒකක** | |
| 2.1. | වාතයේ ඝනත්වය | ඝන මීටර් කිලෝ ග්‍රෑම් |
| 2.2. | වර්ගඵල ඝනත්වය | වර්ග මීටරයට කිලෝ ග්‍රෑම් |
| 2.3. | භාණ්ඩවල ධාරිතාවය | කිලෝ ග්‍රෑම් |
| 2.4. | භාණ්ඩවල ඝනත්වය | ඝන මීටරයට කිලෝ ග්‍රෑම් |
| 2.5. | ස්කන්ධ ඝනත්වය | ඝන මීටරයට කිලෝ ග්‍රෑම් |
| 2.6. | ඉන්ධන ධාරිතාවය | කිලෝ ග්‍රෑම් |
| 2.7. | වායු ඝනත්වය | ඝන මීටරයට කිලෝ ග්‍රෑම් |
| 2.8. | දළ බර හෝ රැගෙන යන භාණ්ඩ ප්‍රමාණය | ටොන් එකකට කිලෝ ග්‍රෑම් |
| 2.9. | ඔසවනු ලබන ස්කන්ධය | කිලෝ ග්‍රෑම් |
| 2.10. | රේඛීය ඝනත්වය | මීටරයට කිලෝ ග්‍රෑම් |
| 2.11. | ද්‍රව්‍යයක ඝනත්වය | ඝන මීටරයට කිලෝ ග්‍රෑම් |
| 2.12. | ස්කන්ධය | කිලෝ ග්‍රෑම් |
| 2.13. | අවස්ථිත ඝූර්ණය | වර්ග මීටර කිලෝ ග්‍රෑම් |
| 2.14. | ගම්‍යතා ඝූර්ණය | තත්පරයට කිලෝ ග්‍රෑම් වර්ග මීටර |
| 2.15. | ගම්‍යතාවය | තත්පරයට මීටර කිලෝ ග්‍රෑම් |

| අනු අංකය | රාශිය | ඒකකය |
|---|---|---|
| 3 | **බලය - අදාල ඒකක** | |
| 3.1. | වායු පීඩනය | කිලෝ පැස්කල් |
| 3.2. | ඇල්ටි මීටර පාඨාංකය | හෙක්ටො පැස්කල් |
| 3.3. | වායුගෝලීය පීඩනය | හෙක්ටො පැස්කල් |
| 3.4. | ගම්‍යතා ඝූර්ණය | කිලෝ නිවුටන් මීටර් |
| 3.5. | බලය | නිව්ටන් |
| 3.6. | ඉන්ධන සැතපුම් පීඩනය | කිලෝ පැස්කල් |
| 3.7. | සම්පීඩක ද්‍රවයේ පීඩනය | කිලෝ පැස්කල් |
| 3.8. | දෘතා මාපාංකය | මෙගා පැස්කල් |
| 3.9. | පීඩනය | කිලෝ පැස්කල් |
| 3.10. | ආතතිය | මෙගා පැස්කල් |
| 3.11. | පෘෂ්ඨීක ආතතිය | මීටරයට මීටර් නිවුටන් |
| 3.12. | අධික සැරක් යෙදෙන බලය | කිලෝ නිවුටන් |
| 3.13. | ව්‍යාවර්ථය | නිවුටන්ල මීටර් |
| 3.14. | රික්තයක පීඩනය | පැස්කල් |
| 4 | **යාන්ත්‍ර විද්‍යාව** | |
| 4.1. | වාතය තුළ වේගය | නාවික හැතැප්ම |
| 4.2. | කෝණික ත්වරණය | තත්පර වර්ගයට රේඩියන් |
| 4.3. | කෝණික ප්‍රවේගය | තත්පරයට රේඩියන් |
| 4.4. | ශක්තිය හෝ කාර්යය | ජූල් |
| 4.5. | යම් බලයකට සමානවනල ෆ්ජ්ට් (රීෂා) එකක් මගින් ලබා ගන්නා බලය | කිලෝ වොට් |
| 4.6. | සංඛ්‍යාතය | හර්ට්ස් |
| 4.7. | භූමිය මත වේගය | නාවික හැතැප්ම |
| 4.8. | ගැටීම | වර්ගමීටරයට ජූල් |
| 4.9. | තිරිංග මගින් ලබාගත් චාලක ශක්තිය | මෙගා ජූල් |
| 4.10. | රේඛිය ත්වරණය | තත්පර වර්ගයට මීටර් |
| 4.11. | ජවය | කිලෝ වොට් |
| 4.12. | යම් කිසි කෝණයක් වෙනස් වන සීඝ්‍රතාවය | තත්පරයට අංශක |
| 4.13. | ෆ්ජ්ට් (රීෂාවක) එකකින් ලබාගන්නා බලය | කිලෝ වොට් |
| 4.14. | ප්‍රවේගය | තත්පරයට මීටර් |
| 4.15. | සිරස් වේගය | විනාඩියට අඩි |
| 4.16. | සුළගේ වේගය | නාවික හැතැප්ම |
| 5 | **ප්‍රවාහය** | |
| 5.1. | එන්ජිම හරහා වාත ප්‍රවාහය | තත්පරයට කිලෝ ග්‍රෑම් |
| 5.2. | එන්ජිම හරහා ජල ප්‍රවාහය | පැයට කිලෝ ග්‍රෑම් |
| 5.3. | ඉන්ධන පරිභෝජනය | කිලෝ වොට් පැයට, කිලෝ ග්‍රෑම් |
| | පිස්ටන් එන්ජින් | කිලෝ වොට් පැයට, කිලෝ ග්‍රෑම් |
| | ටර්බෝ ෆ්ජ්ට් එන්ජින් | කිලෝ වොට් පැයට, කිලෝ ග්‍රෑම් |
| | ජෙට් එන්ජින් | කිලෝ වොට් පැයට, කිලෝ ග්‍රෑම් |
| 5.4. | ඉන්ධන ප්‍රවාහය | පැයට කිලෝ ග්‍රෑම් |
| 5.5. | ඉන්ධන පිරවීමේ සීඝ්‍රතාවය | විනාඩියට කිලෝ ග්‍රෑම් |
| 5.6. | වායු ප්‍රවාහය | තත්පරයට කිලෝ ග්‍රෑම් |
| 5.7. | ද්‍රව ප්‍රවාහය (ස්කන්ධ මිතික) | තත්පරයට ග්‍රෑම් |
| 5.8. | ද්‍රව ප්‍රවාහය (පරිමා මිතික) | තත්පරයට ලීටර් |
| 5.9. | ස්කන්ධ ප්‍රවාහය | තත්පරයට කිලෝ ග්‍රෑම් |

| අනු අංකය | රාශිය | ඒකකය |
|---|---|---|
| 5.10. | ලිහිසි තෙල් පරිභෝජනය | |
| | ටර්බයින් එන්ජින් | පැයට කිලෝ ග්‍රෑම් |
| | පිස්ටන් එන්ජින් | තත්පරයට ග්‍රෑම් |
| 5.11. | ලිහිසිතෙල් ප්‍රවාහය | තත්පරයට ග්‍රෑම් |
| 5.12. | පොම්පයේ ධාරිතාවය | විනාඩියට ලීටර් |
| 5.13. | සංවාතන වායු ප්‍රවාහය | විනාඩියට ඝන මීටර් |
| 5.14. | ගතික දුස්ස්‍රාවිතාවය | පැස්කල් තත්පර |
| 5.15. | ප්‍රගති දුස්ස්‍රාවිතාවය | තත්පරයට වර්ගමීටර |
| 6 | **තාප ගතිකය** | |
| 6.1. | තාප සංසරණ සංගුණකය | වර්ග මීටරයට කෙල්විනයට, වොට් |
| 6.2. | ඒකීය වර්ගඵලයක් තුළින තාප ප්‍රවාහය | වර්ග මීටරයට ජූල් |
| 6.3. | තාප සංසරණ සීඝ්‍රතාවය | වොට් |
| 6.4. | ආර්ද්‍රතාවය (නිරපේක්ෂ) | කිලෝ ග්‍රෑමයට ග්‍රෑම් |
| 6.5. | රේඛීය ප්‍රසාරණ සංගුණකය | සෙල්සියස් අංශකයට |
| 6.6. | තාප ශක්තිය | ජූල් |
| 6.7. | උෂ්ණත්වය | සෙල්සියස් අංශක |
| 7 | **විද්‍යුතය සහ චුම්භකත්වය** | |
| 7.1. | ධාරිතාවය | ෆැරඩ් |
| 7.2. | සන්නයනතාව | සිමෙන්ස් |
| 7.3. | සන්නායකතාව | මීටරයට සීමෙන්ස් |
| 7.4. | ධාරා ඝනත්වය | වර්ගමීටරයට ඇම්පියර් |
| 7.5. | ධාරා විද්‍යුතය | ඇම්පියර් |
| 7.6. | විද්‍යුත් ක්ෂේත්‍රතාවයවර්ග මීටරයට කූලෝම් | |
| 7.7. | විද්‍යුත් විභවය | වෝල්ට් |
| 7.8. | විද්‍යුත් ගාමක බලය | වෝලට් |
| 7.9. | චුම්බක ක්ෂේත්‍රතාවය | මීටරයට ඇම්පියර් |
| 7.10. | චුම්බක ස්‍රාවය | වෙබර් |
| 7.11. | චුම්බක ස්‍රාව ඝනත්වය | ටෙස්ලා |
| 7.12. | ජවය | වොට් |
| 7.13. | විද්‍යුත් ආරෝපන ප්‍රමාණය | කූලෝම් |
| 7.14. | විද්‍යුත් ප්‍රතිරෝධය | ඕම් (ohm) |
| 8 | **ආලෝකය සහ විද්‍යුත් චුම්බක විමෝචනයන්** | |
| 8.1. | ප්‍රදීප්තතාව | ලක්ස් |
| 8.2. | දීප්තතාව | වර්ගමීටරයට කැන්ඩෙලා |
| 8.3. | දීප්තතා විමෝචනය | වර්ගමීටරයට ලූමෙන් |
| 8.4. | දීප්තතා ස්‍රාවය | ලූමෙන් |
| 8.5. | දීප්තතා තීව්‍රතාවය | කැන්ඩෙලා |
| 8.6. | ආලෝක ප්‍රමාණය | ලූමෙන්, තත්පර |
| 8.7. | විකිරන ශක්තිය | ජූල් |
| 8.8. | තරංග ආයාමය | මීටර් |
| 9 | **ධ්වනි විද්‍යාව** | |
| 9.1. | සංඛ්‍යාතය | හර්ට්ස් |
| 9.2. | ද්‍රව්‍ය ඝනත්වය | ඝන මීටරයට කිලෝ ග්‍රෑම් |
| 9.3. | දැඩි ශබ්ද පරිමාණය | ඩෙසිබල් |

| අනු අංකය | රාශිය | ඒකකය |
|---|---|---|
| 9.4. | ආවර්ථ, ආවර්ථ කාලය | තත්පර |
| 9.5. | ධ්වනි තිව්‍රතාවය | වර්ගමීටරයට වොට් |
| 9.6. | ධ්වනි ශක්තිය | වොට් |
| 9.7. | ධ්වනි පීඩනය | පැස්කල් |
| 9.8. | ධ්වනි පරිමාණය | ඩෙසිබල් |
| 9.9. | ස්ථිතික පීඩනය | පැස්කල් |
| 9.10. | ධ්වනි ප්‍රවේගය | තත්පරයට මීටර් |
| 9.11. | පරිමා ප්‍රවාහය | තත්පරයට ඝන මීටර් |
| 9.12. | තරංග ආයාමය | මීටර් |
| 10 | **න්‍යෂ්ඨික විද්‍යාව සහ අයනිකරණ විමෝචනය** | |
| 10.1. | අවපෝෂිත ප්‍රමාණය | ග්‍රේ |
| 10.2. | අවපෝෂිත සීඝ්‍රතාවය | තත්පරයට ග්‍රේ |
| 10.3. | රේඩියෝ නියුක්ලීඩයක ක්‍රියාකාරීත්වය | බෙකරල් |
| 10.4. | දරාගත හැකි විකිරණ ප්‍රමාණය | සීවර්ට් |
| 10.5. | විකිරණ නිරාවරණය | කිලෝ ග්‍රෑමයට කූලෝම් |
| 10.6. | නිරාවරණ සීඝ්‍රතාවය | කිලෝ ග්‍රෑමයට තත්පරයට කූලෝම් |

**වගුව - 01 මිනුම් සඳහා ඒකක**

(අ) මීටර් 40000ට වැඩි ගුවන් ගමනා ගමනයේදී යෙදෙන පරිදි
(ආ) ගුවන් යානා ඉන්ධන ජලය, ලිහිසිතෙල් සහ අධි පීඩන ඔක්සිජන් ඇසුරුම් වැනි දෑ
(ඇ) කිලෝ මීටර් 05ට අඩු පැහැදිලිව දර්ශනය වන දුර ප්‍රමාණයන් මීටර්වලින් දක්වා ඇත
(ඈ) ගුවන් ගමන්වලදී වාතය තුළ වේගය ඇතැම් විට "මැක්" අගය ආශ්‍රයෙන් දක්වා ඇත
(ඉ) ඩෙසිබල් යනු ධ්වනි පීඩන හා ශක්ති මට්ටම් මැනීමට යොදා ගන්නා ඒකකයකි. එය නිශ්චිත මට්ටමට සාපේක්ෂව සඳහන් කළ යුතුයි

**ජාත්‍යන්තර සම්මත ඒකක උපසර්ග**

දෙවන වගුවේ දක්වා ඇති උපසර්ග සහ සංකේතයන් ඃ

දහයේ ගුණාකාර සහ ජාත්‍යන්තර සම්මත ඒකකවල උප ගුණාකාරයන්ගේ නම් සහ සංකේත දැක්වීමට යොදා ගනු ලබයි

| *ගුණ කිරීමේ සාධකය* | *උපසර්ගය* | *සංකේතය* |
|---|---|---|
| $1\,000,000,000,000,000,000 = 10^{18}$ | එක්සා | E |
| $1\,000,000,000,000,000 = 10^{15}$ | පීටා | P |
| $1\,000,000,000,000 = 10^{12}$ | ටෙරා | T |
| $1\,000,000,000 = 10^{9}$ | ගිගා | G |
| $1\,000,000 = 10^{6}$ | මෙගා | M |
| $1\,000 = 10^{3}$ | කිලෝ | k |
| $100 = 10^{2}$ | හෙක්ටා | h |
| $10 = 10^{1}$ | ඩෙකා | da |
| $0.1 = 10^{-1}$ | ඩෙසි | d |
| $0.01 = 10^{-2}$ | සෙන්ටි | c |
| $0.001 = 10^{-3}$ | මිලි | m |
| $0.000,001 = 10^{-6}$ | මයික්‍රො | M |
| $0.000,000,001 = 10^{-9}$ | නැනෝ | n |
| $0.000,000,000,001 = 10^{-12}$ | පීකෝ | P |
| $0.000,000,000,000,001 = 10^{-15}$ | ෆෙම්ටෝ | f |
| $0.000,000,000,000,000,001 = 10^{-18}$ | ඇපෝ | a |

වගුව - 02 ඒකක උපසර්ග

**ජාත්‍යන්තර සම්මත නොවන ඒකක**

වගුව - 03හි දක්වා ඇති ජාත්‍යන්තර සම්මත නොවන ඒකක ආදේශක ඒකකයන් වශයෙන් පළමු වගුවෙහි දක්වා ඇති විශේෂිත රාශීන් සඳහා පමණක් භාවිතා කරනු ලබයි.

| *වගුව 01හි ඇති විශේෂිත වූ රාශීන්* | *ඒකකය* | *සංකේතය* | *නිර්වචනය* |
|---|---|---|---|
| ස්කන්ධය | ටොන් | t | 1t = $10^3$ කිලෝ ග්‍රෑම් |
| තල කෝණය | අංශක<br>කලා<br>විකලා | O<br>O<br>O | $1^0 = (\pi/180)$ රේඩියන්<br>$1' = (\pi/60)^0 = (\pi/10800)$ රේඩියන්<br>$1'' = (\pi/60)' = (\pi/6481000)$ රේඩියන් |
| උෂ්ණත්වය | සෙල්සියස් අංශක | $^0$C | $1'' = (\pi/60)' = (\pi/648000)$ රේඩියන් |
| කාලය | විනාඩි<br>පැය<br>දිග<br>සති | වි<br>පැ<br>දින<br>සති | 1වි = 60 තත්පර<br>1 පැ = 60 විනාඩි = 3600 තත්පර<br>1 දින = 24 පැය = 86400 තත්පර |
| පරිමාව | ලීටර | ලී | 1ලී = 1 ඝන ඩෙසි මීටර් = $10^{-3}$ ඝන මීටර් |

වගුව - 03, ජාත්‍යන්තර සම්මත නොවන ඒකක

**උෂ්ණත්වය පරිවර්තන සූත්‍රයන්**

වගුව - 04 හි දක්වා ඇති පරිවර්තන අගයන් සෙල්සියස් අගයක් කෙල්වින් අගයක් බවට මෙන්ම කෙල්වින් අගයන් සෙල්සියස් අගයන් බවට ද පරිවර්තනය කිරීමට යොදා ගනී

| උෂ්ණත්ව රාශිය බවට හැරවීමට | + | යොදන සූත්‍රය |
|---|---|---|
| සෙල්සියස් ($^0$C) | කෙල්වින් (K) | $K = {}^0C + 273.15$ |
| ෆ්රැන්හයිට් ($^0$F) | සෙල්සියස් ($^0$C) | ${}^0C = ({}^0F - 32) / 1.8$ |
| ෆ්රැන්හයිට් ($^0$F) | කෙල්වින් (K) | $K = ({}^0F + 459.67) / 1.8$ |
| කෙල්වින් (K) | සෙල්සියස් ($^0$C) | ${}^0C = K - 273.15$ |
| රැන්කින් ($^0$R) | කෙල්වින් (K) | $K = {}^0R / 1.8$ |

වගුව - 04 උෂ්ණත්ව ඒකක පරිවර්තනය

**දුර වේග පරිවර්තිත සූත්‍රයන්**
(උන්නතාංශය, උස් මට්ටම, උස, සිරස් වේගය)

| *රාශිය* | *බවට හැරවීමට* | *යොදන සූත්‍රය* |
|---|---|---|
| නාවික හැතැප්මය | මීටර | 1 NM = 1852 මීටර් |
| අඩිය | මීටර | 1 ft = 0.3048 මීටර් |
| පැයට නාවික සැතැප්ම | තත්පරයට මීටර් | 1 = 0.5144494 තත්පරයට මීටර් |

වගුව 5 - දුර/වේග පරිවර්තන සූත්‍රයන්

**2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනත**

**ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් : 83 වන ව්‍යවස්ථාවේ ඊසි සම්මුතීන් යටතේ බලපත්‍ර හා ගුවන් යානා ක්‍රියාකරවීම පිළිබඳව නිකුත් කළ සහතික පිළිගැනීම.**

සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල්, එච්. එම්. සී. නිමල්සිරි වන මම, 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනතේ 120 (1) වගන්තිය ප්‍රකාරව මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් මින් නිකුත් කරමි.

එච්. එම්. සී. නිමල්සිරි,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්
සහ ප්‍රධාන විධායක නිලධාරී.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,
අංක 04, හුණුපිටිය පාර,
කොළඹ 02.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

**ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති**

(2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනතේ 120 වගන්තිය ප්‍රකාර නිකුත් කරන ලදී)

**මාතෘකාව : 83 Bis ව්‍යවස්ථා ගිවිසුම් යටතේ මෙහෙයුම් සිදු කරන ගුවන් යානා සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සහ සහතික පිළිගැනීම**

**යොමු අංක :** CA-IS-2011-GEN-002 **අනු අංකය :** IS-004 **දිනය : 2011 අප්‍රේල් 28**

1. මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියට යොමු කළ යුත්තේ එහි යොමු අංකය, අනුක්‍රමික අංකය (SN) සහ ඉහත දැක්වෙන දිනය සමඟ එහි මාතෘකාව ද සඳහන් කිරීමෙන් ය.

2. මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිය නිකුත් කරනු ලබන්නේ 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනතේ විධිවිධාන ප්‍රකාරවය.

   (අ) 2 වගන්තිය- ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා කාර්යයන් පාලනය කිරීමේ සම්මුතිය
   (ආ) 77 වගන්තිය - බදු ගිවිසුමක්, කුලී ගිවිසුමක් හෝ හුවමාරු කරගැනීමේ ගිවිසුමක් හෝ යටතේ මෙහෙයුම් සිදු කරනු ලබන ගුවන් යානා
   (ඇ) උපලේඛනයේ 33 වන ව්‍යවස්ථාව - සහතික සහ බලපත්‍ර පිළිගැනීම
   (ඈ) උපලේඛනයේ 83 Bis ව්‍යවස්ථාව

3. "වාණිජ ගුවන් ප්‍රවාහණ මෙහෙයුම්වල යොදවා ඇති ගුවන් යානාවන්හි බදු සහ කුලී මෙහෙයුම්" සම්බන්ධයෙන් වූ අංක 119 ගුවන් සේවා නිරුපද්‍රතතා නිවේදනයට (ASN 119) පරිපූරකයක් වශයෙන් මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිය නිකුත් කරනු ලැබේ

4. මෙහෙයුම්කරුගේ රාජ්‍යය සහ තුන්වන පාර්ශ්වයේ රාජ්‍යයන් අතර ඇති කරගත් 83 Bis ව්‍යවස්ථා ගිවිසුමක් යටතේ මෙහෙයුම් කරනු ලබන ගුවන් යානා වෙනුවෙන් මෙහෙයුම් කරුගේ රාජ්‍යය විසින් නිකුත් කරන ලද, අළුත් කරන ලද හෝ වලංගු භාවයට පත්කරන ලද හෝ ගුවන් යෝග්‍යතා සහතික, ගුවන් විදුලි බලපත්‍ර, පුද්ගල බලපත්‍ර, පුද්ගල බලපත්‍ර සහ නිපුණතා සහතික සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පිළිගනු ලබයි. එසේ පිළිගනු ලබන්නේ එවැනි සහතික හෝ බලපත්‍ර හෝ නිකුත් කිරීමේදී හෝ වලංගු භාවයට පත්කිරීමේදී හෝ යටත් කර ඇති අවශ්‍යතා, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් නියම කරන ලද අවම අවශ්‍යතාවන්ට සමාන නම් හෝ ඉහළ නම් හෝ පමණකි.

5. සම්මුතියේ 83 Bis ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් යානයක් මෙහෙයුම් කිරීම වෙනත් රාජ්‍යයකට පැවරීම සඳහා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් එකී රාජ්‍යයේ සිවිල් ගුවන් සේවා බලධාරීන් සමඟ ගිවිසුමකට එළඹී අවස්ථාවක, ලියාපදිංචි කිරීමේ රාජ්‍යය වශයෙන් අදාළ ගුවන් යානය සම්බන්ධයෙන් ඉටු කළ යුතුව ඇති නිරුපද්‍රතතා අධීක්ෂණ කාර්යයන් එකී අනෙක් රාජ්‍යය වෙත පවරා දීමට සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්ට පිළිවන.

6. වෙනත් රාජ්‍යයක ලියාපදිංචි කරන ලද ගුවන් යානයක් සම්මුතියේ 83 Bis ව්‍යවස්ථාව යටතේ මෙහෙයුම් කිරීම සඳහා එකී වෙනත් රාජ්‍යයේ සිවිල් ගුවන් සේවා බලධාරීන් සමඟ ගිවිසුමකට එළඹී අවස්ථාවකදී මෙහෙයුම් කරුගේ රාජ්‍යය වශයෙන් එකී ගුවන් යානයට අදාළ නිරුපද්‍රතා අධීක්ෂණ කාර්යයන් ඉටු කිරීම එකී වෙනත් රාජ්‍යයේ තමන් වෙත පවරා ගැනීමට ද සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්ට පිළිවන.

7. සම්මුතියේ 83 Bis ව්‍යවස්ථාව යටතේ මෙහෙයුම් සිදු කරනු ලබන ශ්‍රී ලංකාවේ ලියාපදිංචි එකිනෙක ගුවන් යානයක් සම්බන්ධයෙන් වූ පැවරුම් වැඩපිළිවෙලට අදාල තොරතුරු ICAO වෙත සහ අනෙකුත් ප්‍රවේදිත රාජ්‍යයන් වෙත නිවේදනය කරනු ඇත.

8. මෙම ක්‍රියාත්මක කිරමේ ප්‍රමිතිය වහාම ක්‍රියාත්මක වන පරිදි බලාත්මක විය යුතු අතර නැවත දැනුම් දෙන තුරු එසේ බලාත්මකව පැවතිය යුතුය.

එච්. එම්. සී. නිමල්සිරි,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්
සහ ප්‍රධාන විධායක නිලධාරී.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,
අංක 04, හුණුපිටිය පාර,
කොළඹ 02.

7-467/4

---

**2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනත**

**ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් : අවශ්‍යතා ඉල්ලා සිටීමේ වගකීමෙන් මුක්ත වීම**

සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල්, එච්. එම්. සී. නිමල්සිරි වන මම, 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනතේ 120 (1) වගන්තිය ප්‍රකාරව මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් මින් නිකුත් කරමි.

එච්. එම්. සී. නිමල්සිරි,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්
සහ ප්‍රධාන විධායක නිලධාරී.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,
64, ගාලු පාර,
කොළඹ 03.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

**ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති**

(2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනතේ 120 වගන්තිය යටතේ නිකුත් කරන ලදී.)

**මාතෘකාව : ප්‍රමිති අනුගමනය කිරීමේ අවශ්‍යතාවෙන් නිදහස් කිරීම**

**යොමු අංක :** CA-IS-2011-GEN-001 **අනු අංකය :** IS-005 **දිනය : 2011 මැයි 06**

1. මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියට යොමු කළ යුත්තේ එහි යොමු අංකය, අනුක්‍රමික අංකය සහ දිනය යෙදීමෙන්ය.

2. මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියෙහි විෂය කරුණට අදාළ නෛතික විධිවිධාන පහත සඳහන් වේ.
2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනත

(අ) 2 වගන්තිය
(ආ) 120 වගන්තිය
(ඇ) උපලේඛනයෙහි ව්‍යවස්ථා අංක 39 සහ 40

1955 ගුවන් සංතරණ රෙගුලාසි

(අ) 19 රෙගුලාසිය
(ආ) 27 රෙගුලාසිය
(ඇ) 34 රෙගුලාසිය
(ඈ) 53 රෙගුලාසිය
(ඉ) 81 රෙගුලාසිය
(ඊ) 188 රෙගුලාසිය
(උ) 199 රෙගුලාසිය
(ඌ) 207 රෙගුලාසිය
(එ) 289 රෙගුලාසිය

3. (අ) ICAO විසින් සම්මත කරන ලද කිසියම් ජාත්‍යන්තර ප්‍රමිතියක් සමග හෝ කාර්ය පටිපාටියක් සමග හෝ සර්වප්‍රකාරයෙන්ම අනුවෘත්‍යය පවත්වාගෙන යාම ප්‍රායෝගික වශයෙන් නොකළ හැකි බව හෝ

(ආ) කිසියම් ICAO ප්‍රමිතියක් හෝ කාර්ය පටිපාටියක් හෝ සංශෝධනය කිරීමෙන් පසු, ජාතික රෙගුලාසි හෝ පරිචයන් හෝ සර්වප්‍රකාරයෙන්ම එකී සංශෝධිත ICAO ප්‍රමිතිය හෝ කාර්ය පටිපාටිය සමඟ එකඟ වන අන්දමින් කටයුතු කිරීම ප්‍රායෝගික වශයෙන් නොකළ හැකි බව හෝ

(ඇ) ICAO ජාත්‍යන්තර ප්‍රමිතියක් මගින් ස්ථාපනය කරන ලද රෙගුලාසි හා පරිචයන්ගෙන් කිසියම් නිශ්චිත ආකාරයකින් වෙනස් වන රෙගුලාසි හෝ පරිචයන් හෝ දේශීය වශයෙන් සම්මත කර ගැනීම අවශ්‍ය වන බව හෝ

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් වරයාට පෙනී ගිය අවස්ථාවක, ඔහු වහාම ශ්‍රී ලංකාවේ ජාතික පරිචයන් සහ ජාත්‍යන්තර ප්‍රමිති මගින් සම්මත කර ඇති පරිචයන් අතර පවතින වෙනස් කම් පිළිබඳව ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය වෙත නිවේදනය කරනු ඇත. එමෙන්ම එම නිවේදනයෙහි සාරාංශයක් ශ්‍රී ලංකා ගගන නාවික තොරතුරු ප්‍රකාශනයෙහි ද පළ කරනු ඇත.

4. ගුවන් යෝග්‍යතාව හෝ ක්‍රියාකාරීත්වය හෝ පිළිබඳ ICAO ජාත්‍යන්තර ප්‍රමිතියකට යටත් විය යුතු කිසියම් ගුවන් යානයක් හෝ බලෝත්පාදකයක් හෝ ඉන් කොටසක් හෝ, එය සහතික කරනු ලබන අවස්ථාවේදී කිනම් ආකාරයකින් හෝ එකී ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූල නොවන්නේනම් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ඊට නිකුත් කරනු ලබන සහතිකයෙහි එය ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූල නොවන ආකාරය පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ඇතුළත් කරනු ලැබිය යුතුය. එසේ නැතහොත් සහතිකයට අමුණා තබනු ලැබිය යුතුය.

5. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් හෝ සහතිකයක් හෝ දරණ කිසියම් පුද්ගලයෙකු, ගුවන් යානා මෙහෙයුම් කරුවෙකු, පුහුණු සංවිධානයක් හෝ ගගන නාවික සේවා සපයන්නෙකු හෝ අදාල බලපත්‍රයේ හෝ සහතිකයෙහි හෝ පංතියට අදාළ ජාත්‍යන්තර ප්‍රමිතියේ නියමිත කොන්දේසි සර්වප්‍රකාරයෙන්ම සම්පූර්ණ නොකරන්නේනම් එවැනි බලපත්‍රයක හෝ සහතිකයද එය ජාත්‍යන්තර ප්‍රමිතීන් සමඟ අනුකූල නොවන ආකාරය පිළිබඳ සම්පූර්ණයෙන් විස්තරයක් ඇතුළත් කරනු ලැබිය යුතුය. එසේ නැතහොත් ඊට අමුණා තබනු ලැබිය යුතුය.

6. මෙසේ ඉහත 4 සහ 5 ඡේදයෙහි දැක්වෙන ආකාරයට ජාත්‍යන්තර ප්‍රමිති සමඟ අනුකූල නොවීම පිළිබඳ විස්තර ඇතුළත කරන ලද හෝ අමුණා තබන ලද හෝ බලපත්‍ර හෝ සහතික හෝ දරණ කිසිදු ගුවන් යානයක්, සංවිධානයක් හෝ පුද්ගලයෙක් හෝ ඒ සඳහා ඔවුන් ඇතුල් වන රාජ්‍යයේ අවසරයකින් තොරව ජාත්‍යන්තර ගුවන් සේවා කාර්යයන්හි නිරත නොවිය යුතු ය.

7. බලපත්‍ර මත හෝ සහතික මත හෝ ඉහත 4 සහ 5 ඡේද යටතේ ජාත්‍යන්තර ප්‍රමිති සමඟ අනුකූල නොවීම පිළිබඳ විස්තර ඇතුළත් කරන ලද හෝ තබන ලද හෝ අවස්ථා මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියෙහි කාර්යයන් සඳහා මින්මතු ''නිදහස් කිරීම්'' යනුවෙන් හඳුන්වනු ඇත.

8. මෙහි 7 වන ඡේදයෙහි සඳහන් නිදහස් කිරීම කිසිවක් ප්‍රදානය කිරීම පිණිස අදාල පුද්ගලයා වෙතින් හෝ සංවිධානය වෙතින් හෝ සිය ඉල්ලීම සාධාරණීකරණය කරමින් ඒ සඳහා නියමිත ආකෘතියෙහි සම්පූර්ණ කරන ලද ලිඛිත ඉල්ලුම් පත්‍රයක් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබිය යුතුය.

9. නිදහසු කිරීමක් ප්‍රදානය කිරීමට පෙර සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් එකිනෙක ඉල්ලීමට අදාල තත්ත්වයන් පිළිබඳව පහත සඳහන් පරිදි සෑහීමකට පත්වීම අවශ්‍ය වේ.

(අ) අදාළ ප්‍රමිති අවශ්‍යතාව සමඟ සාරානුකූලව අනුවෘත්‍යය පවත්වා ඇති හෙයින් ඒ සමඟ තවදුරටත් අනුකූල වීමක් අවශ්‍ය නොවන බව හෝ

(ආ) අදාල අවශ්‍යතාවට සමාන මට්ටමකින් හෝ වඩාත් හොඳින් හෝ ආරක්ෂාව ලබා දෙන අනුවෘත්‍යය පැවැත්වීමේ විකල්ප ක්‍රමයක් තිබෙන බව ඉල්ලුම්කරු සුවිදර්ශනය කර ඇති බව හෝ

(ඇ) නියම කර ඇති ප්‍රමිති අවශ්‍යතා නිශ්චිත කරුණු සඳහා පැහැදිලිවම හේතු සහගත නොවන බව හෝ නොගැලපෙන බව හෝ අදාළ ප්‍රමිති අවශ්‍යතා නිශ්චිත අවස්ථාව සඳහා අනවශ්‍ය හෝ නොගැලපෙන හෝ තත්ත්වයට පත්කෙරෙන සිද්ධීන් සිදු වී ඇති බව හෝ

(ඈ) නිදහස් කිරීම ප්‍රදානය කිරීමේ හේතුවෙන් සුරක්ෂිතතාව සම්බන්ධයෙන් පවතින අවදානම වැඩි නොවන බව

(ඉ) ඉල්ලා ඇති නිදහස් කිරීම හේතුවෙන් කිසියම් ආකාරයක හෝ විභේදනයක් නිර්මාණය නොවන බව හෝ ඉල්ලුම්කරුට අයුතු වාසියක් නොලැබෙන බව සහ

(ඊ) ඉල්ලා ඇති නිදහස් කිරීම නිසා අනෙකුත් ප්‍රකාශිත අවශ්‍යතා මත අහිතකර බලපෑමක් ඇති නොවන බව

10. ඉහත 9 වන ඡේදයේ සඳහන් කාර්යයන් සඳහා, උචිත අවස්ථාවක අදාල ප්‍රමිති අවශ්‍යතාවෙන් නිදහස් කිරීමක් අපේක්ෂා කරන කාරණය සම්බන්ධව අවදානම් තක්සේරුවක් හෝ ගගන නාවික අධ්‍යාපනයක් හෝ පවත්වා එහි ප්‍රතිඵල ඉදිරිපත් කරන ලෙස සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලුම්කරුට නියම කරනු ලැබිය හැකිය.

11. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රදානය කරනු ලබන කිසියම් නිදහස් කිරීමක් කාලයකට සීමා වනු ඇති අතර එකී නිදහස් කිරීම ඒ සමඟ නිකුත් කරනු ලබන බලපත්‍රය මත හෝ සහතිකය මත හෝ සැකෙවින් සටහන් කෙරෙනු ඇත.

12. නිදහස් කිරීම් සීමා සහිත කාල සීමාවක් සඳහා ප්‍රදානය කරන විට සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් ඒ පිළිබඳව අවශ්‍ය අනුගාමී කටයුතු ද ඉටු කරනු ඇත.

13. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රදානය කරනු ලබන කිසියම් නිදහස් කිරීමක්, එය ප්‍රදානය කරන ලද නිශ්චිත කාරණය සඳහා පමණක් අදාල වන අතර සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිඛිත අනුමැතිය රහිතව වෙනත් සමාන කරුණු වෙනුවෙන් මොනම ආකාරයකින්වත් යොදා නොගත යුතුය.

14. ඉල්ලුම් කරුවෙකුට සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම් කිසිවක් පැවරිය හැකි නොවිය යුතුය.

15. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින්, ප්‍රදානය කරන ලද නිදහස් කිරීම් දක්වෙන යාවත්කාල ලැයිස්තුවක් පවත්වාගෙන යනු ඇත.

16. මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියෙහි අඩංගු විධිවිධාන කිසිවක්, නිදහස් කිරීම් ලබා නොදෙනු ඇතැයි නිශ්චිත වශයෙන් නියම කර ඇති වෙනත් කිසියම් රීතියක් සම්බන්ධයෙන් හෝ රෙගුලාසියක් සම්බන්ධයෙන් හෝ අදාළ කර නොගත යුතුය.

එච්. එම්. සී. නිමල්සිරි,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්
සහ ප්‍රධාන විධායක නිලධාරී.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,
අංක 04, හුණුපිටිය පාර,
කොළඹ 02.

07-467/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.